තුම්හේහි කිච්චං ආතප්පං

The Magazine by

# පෙරමග



2021 පෙබරවාරි - දෙවන කලාපය

පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයට අනුබද්ධ දශක කණ්ඩායමක් වන පෙරමග දශක කණ්ඩායම විසින් සම්පාදිතයි.

## ගෙවූ වසරේ මතකයන් බිඳක් .......



**PERAMAGA DECADE GROUP**
Past Pupils' Association
Dharmapala Vidyalaya, Pannipitiya
Web: www:peramaga-dvp.org
E mail: peramaga.dvp@gmail.com
Contact: 077 665 6628

04 පිටුව — "පෙරමගින් පෙරමගට" සමාජ මෙහෙවර

06 පිටුව — දම්පල් අභිමානයේ ප්‍රෞඪ සළකුණ

08 පිටුව — A Gifted Healer And A Proud Palian Dr. Hemantha Perera:

13 පිටුව — තරුවක් සමග වරුවක්

10 පිටුව — විදුහල බබළවන පෙරමග ව්‍යාපෘති

14 පිටුව — සෞන්දර්යය අංශයෙන් දම්පල් කිරුළ බබළවන සොඳුරු මිණිකැට

16 පිටුව — අපේ කාලේ දම්පල් අඹරේ පැයු ගුරු තරුව

17 පිටුව — කැටපත් පවුර

18 පිටුව — Sports Corner

**පෙරමග දශක කණ්ඩායම**

## විධායක සභාව

**2020/2021**

**සභාපති** සුලක්ෂණ විදුරංග - 0714 85 89 85

**ලේකම්** දිනේෂා ජයමාන්න - 0766 661 080

**ප්‍රධාන උප සභාපති**

පෙවින්ද බැලගම - 0715 826 985

**උප සභාපති** රනිල් සම්පත් - 0715 998 399

චරිත චන්දන පෙරේරා - 0712 179 169

**ප්‍රධාන උප ලේකම්**

ධනංජ ඇල්විටිගල - 0711 050 234

**උප ලේකම්**

චමිදු විජයවර්ධන - 0718 984 600

ජේ. ඩබ්. එන් සාලින්ද - 0713 206 086

**භාණ්ඩාගාරික**

ශිවන්ත කොස්වත්තගේ -0777 787 548

**උප භාණ්ඩාගාරික**

තිළිණි ශ්‍යාලිකා - 0771 789 715

**සංවිධායක** යසන්ත ඉන්දීවර - 0714 499 821

**උප සංවිධායක** හර්ෂ රණසිංහ - 0765 364 036

**සංස්කාරක** නිෂාදි රුක්ෂාණි - 0718 513 098

**ද්වි වාර්ෂික සම්බන්ධීකාරක**

රසික මධුසංක - 0715 344 333

**හිටපු සභාපති** බුද්ධික රොෂාන්

**කාරක සභිකයින්**

රුවන් කුමාරගේ, එච්. එම්. චතුරි කෝකිලා

ගීතක පෙරේරා, අප්සරා මධුවන්ති

දිලිනි ලංකිකා ලියනගේ

මහවත්තගේ රෝෂන, ක්‍රිෂාන්ති සපුකොටනගේ

සුමුදු ගීගනගේ , තරිඳු පෙරේරා

ජේ.එම්.ජී.ටී. ජයසේකර

කල්පිත කෝදාමුල්ල, මේබලා නදීශානි ප්‍රනාන්දු

ඉසුරු උදාර උඩුවන, අරුණි ලියනගේ

තිළිණ භාග්‍ය අබේසේකර

ඩබ්ලිව්.ඒ.ටී. මදුරංගි, රමේෂ් මාරසිංහ

ඩබ්.ඒ.ඩී. ගයනි කෞෂල්‍යා,අධීෂ තරිඳු මාලිංග

චරිතා සෙනවිරත්න

---

The Magazine by පෙරමග

2021 පෙබරවාරි - දෙවන කලාපය

**සංස්කරණය** එස්.පී.නිශාදි රුක්ෂාණි

**විශේෂාංග ලිපි සැකසීම**

දිනේෂා ජයමාන්න (1)
අරුණි මහේෂිකා ලියනගේ (2)
හියල් චතුර බියගමගේ (3)
කල්පිත කෝදාමුල්ල (4)
තිළිණි ශ්‍යාලිකා තිලකරත්න (5)
මේබලා නදීශානි ප්‍රනාන්දු (6)
චමිදු විජයවර්ධන (7)
හර්ෂ රණසිංහ (8)
ධනංජ ඇල්විටිගල (9)

**පරිගණක නිර්මාණකරණය**

නිෂාදි රුක්ෂානි

**සෝදුපත් පරික්ෂාව**

දිනේෂා ජයමාන්න (1)
ධනංජ ඇල්විටිගල (9)
තිළිණි ශ්‍යාලිකා (5)
අරුණි මහේෂිකා (2)
දුරේකා මධුෂානි (11)

**අනුශාසක මණ්ඩලය**

බුද්ධික රොෂාන් (10)

---



*පෙරමග දශක කණ්ඩායමේ*

## සභාපතිතුමන්ගෙන්

*වචනයක් ...*

දම්පල් මැණියන්ගේ සිප්සතර හැදෑරූ අප හට කෘතගුණ ලෙස දම්පල් මැණියන් වෙත දිය හැකි යමක් වේ නම් එය භාග්‍යට කරුණකි. දශක එකහමාරකට ආසන්න කාලයක් පුරා සමස්ථ ආදිශිෂ්‍යයන් වෙනුවෙන් කීර්තිමත් දශක කණ්ඩායමක් ලෙස පෙරමග ගැනීමට අප කණ්ඩායමට හැකියාව ලැබිණි. එදා මෙදාතුර එම කීර්තියට උරදුන් සියල්ලෝ එම භාග්‍යයට හිමිකම් කියති. වර්තමානය වන විට අප 'පෙරමග' ආදි ශිෂ්‍ය මව් සංගමයට රුකුලක් වෙමින් පාසලේ කීර්තිනාමය ඉහළ නැංවීමට කටයුතු කරමින් සිටී. එමෙන්ම පාසලේ භෞතික සම්පත් සංවර්ධනය, අධ්‍යාපනය, ක්‍රීඩාව, සෞන්දර්ය ඉහළ ගෙන ඒම මෙන්ම වර්තමාන දූවා දරුවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කරයි. පාසල වෙනුවෙන් කැපවුණු පෙරමග දශක කණ්ඩායමේ වර්තමාන සභාපතිවරයා වීම මා ලද භාග්‍යයකි. අප දශක කණ්ඩායම විසින් පසුගිය වසරේ සිට ආරම්භ කරන ලද පෙරමග වාර්ෂික සඟරාවෙහි දෙවන කලාපය වන මෙහි ප්‍රධාන අරමුණ වන්නේ අප විසින් පාසල තුළ සිදුකල ක්‍රියාකාරකම්, සිදු කරමින් සිටින ක්‍රියාකාරකම් සහ ඉදිරියට සිදුකරන ව්‍යාපෘතීන් පිළිබඳ සමස්ථ සාමාජිකයන් දැනුවත් කිරීමයි. හරහා සාමාජික ඇල්ම වැඩිවී සාමාජික ශක්තිය වැඩි වී මව් සංගමයට ශක්තියක් සැපයීම හරහා පාසල තව තවත් ඉහළ තලයකට ගෙනයාහැකි බව අපගේ විශ්වාසයයි.

එමෙන්ම තවතවත් පෙරමග ඉදිරියට හා දියුණුව කරා රැගෙන යාමට අප සාමාජිකයන් එක්ව එකමුතුව කටයුතු කරමු යැයි ඉල්ලා සිටින අතර, මෙම සඟරාව සාර්ථකව ඉදිරිපත් කිරීමට ඇපකැප වූ වර්තමාන සංස්කාරක තුමිය ඇතුළු සඟරා කමිටුවට ස්තුතිවන්ත වෙමින් ඉදිරියට මෙම සඟරාව සාර්ථකව නිර්මාණශීලීව සිදු කිරීමට හැකියාව ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

**සුලක්ෂණ විදුරංග** - සභාපති - පෙරමග දශක කණ්ඩායම



*පෙරමග දශක කණ්ඩායමේ*

## ලේකම්තුමියගෙන්

*වචනයක් ...*

අඛණ්ඩව දෙවන වරටත් සහෘද පෙරමග සාමාජික සාමාජිකාවන් අතට පත්වන පෙරමග සඟරාව බොහෝ දෙනාගේ වෙහෙස මහන්සියේ සුන්දර ප්‍රතිඵලයකි. සඟරාවක් අඛණ්ඩව ප්‍රකාශයට පත් කිරීමේදී නිරායාසයෙන්ම මතුවන දුෂ්කරතාව මැඩගෙන ඉවසීමෙන් හා වෙහෙස මහන්සියෙන් එම අභියෝගය ජයගැනීමට පෙරමග සඟරා කමිටුවට හැකියාව ලැබී ඇත. අද ඔබ අතට පත්වන පෙරමග සඟරාව අති සාර්ථක අයුරින් නිර්මාණය කළ පෙරමග සඟරා කමිටුවට මාගේ හද පිරි ප්‍රණාමය පුද කරන අතර ලබන වසරේදීත් සාර්ථක පෙරමග සඟරාවක් නිර්මාණය වනු ඇතැයි හදවතින්ම අපේක්ෂා කරමි.

**දිනේෂා නදීශානි ජයමාන්න** - ලේකම් - පෙරමග දශක කණ්ඩායම



*පෙරමග දශක කණ්ඩායමේ*

## සංස්කාරකතුමියගෙන්

*වචනයක් ...*

දෙවන වරටත් ඉතාම සාර්ථකව එළි දැක්වූ පෙරමග සඟරාවේ සංස්කාරකවරිය වශයෙන් මා තුල ඇත්තේ ඉතාමත් ආඩම්බරයකි. ගෝලීය වසංගතයක් පවතින මේ අවස්ථාවේ දී අපගේ ජීවිතවලට බොහෝ බලපෑම් එල්ල වුවත් තම තමන්ට භාරදුන් කාර්යයන් ඉතාම සාර්ථකව නිම කර දීමට මාගේ සඟරා කමිටුවට හැකි වීම මා ලද භාග්‍යයකි. 2020 /2021 පරිපාලන වර්ෂයේ පෙරමග සභාපතිතුමන් ඇතුලු සමස්ථ විධායක කමිටු සාමාජික සාමාජිකාවනට හා අප විදුහලේ විදුහල්පතිතුමන් මෙන්ම ආදි ශිෂ්‍ය සංගමයේ සභාපතිතුමා, ප්‍රධාන ලේකම්තුමන් ඇතුලු සහයෝගය දැක්වූ සියලුම දෙනාට මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි. එමෙන්ම මේ සඟරාවේ සාර්ථක අසාර්ථකත්වය පිළිබඳ අදහස් දැක්වීම පෙරමග පාඨක ඔබට භාර කරමින් ඉදිරි වර්ෂ වලදීත් මෙයට වඩා සාර්ථක සඟරාවන් එළි දැක්වීමට හැකි වේවායි මා මුලු හදවතින්ම පතමි.

*පෙරමගින් පෙම්මං තනන පෙරගමන්කරුවනි ඔබලාට ස්තූතියි...*

**එස්.පී.නිශාදි රුක්ෂාණි** - සංස්කාරක - පෙරමග දශක කණ්ඩායම

### පෙරමග සඟරා කමිටුව





## ආදි ශිෂ්‍ය සංගමයේ සභාපති, ගරු, විදුහල්පතිතුමාගෙන් සුභාසිංශන .....

ලේඛන කලාව ආරම්භ වීම සිදුවූයේ මුද්‍රණ ශිල්පයේ ආරම්භයටත් පෙරයි. වර්ෂ 1390 දී පමණ ජොහැනස් ගුටෙන්බර්ග්ගේ නිර්මාණ ශීලීත්වයෙන් ලේඛන කලාවේ විප්ලවීය වෙනසක් ඇති විය. මෙලෙස ප්‍රගමනයට ලක් වූ ලේඛන කලාව අද ඉතා දියුණු අස්ථානයකට පැමිණ ඇති බව පෙනේ.

ධර්මපාල විද්‍යාලයීය දරුවන්ටත්, ගුරුභවතුන්ටත්, දෙමව්පියන්ටත්, ජීවිතයට පෙරමග පෙන්වන 'පෙරමග' සැබවින්ම පෙරමගක් වූ මෙම සඟරාව වාර්ෂිකව එළිදැක්වීමට පෙරමග දශක කණ්ඩායම ගන්නා වූ ප්‍රයත්නය ප්‍රශංසනීය කටයුත්තක් බව කිව යුතුය.

ලොව ප්‍රකට ලේඛකයෙකු, චින්තකයෙකු වූ ප්‍රැන්සිස් බේකන් (1561-1626) ගේ ප්‍රකට කියමනක් මේ අවස්ථාවේ මා සිහියට නැගේ, ''කියවීම මිනිසෙකු සම්පූර්ණ කරයි, සම්භාෂණය කාර්යක්ෂම මිනිසෙකු කරයි, ලිවීම ස්ථිරසාර මිනිසෙකු කරයි''

ඒ අනුසාරයෙන් පෙරමග දශක කණ්ඩායම ජාතියේ දරුවන් ස්ථිරසාර පෞර්ෂයකින් හෙබි මිනිසුන් කරන්නට දරණ මේ ප්‍රයත්නයට මගේ ද විද්‍යාලයේ ද සුභාශිංසන එක්කරමින් අරිසෙන් අහුබුදු ශූරීන් විසින් පබැදි දම්පල් ප්‍රතිඥාව නැවත නැවත සිහිකොට දීමට කැමැත්තෙමි.

*දම්පල් ඍම්දු දුන්*
*රන් ඔවා ලෙහි*
*හොවා*
*දිවි පෙවත සුඍරු කළ*
*මෙ දම්පල් විදු සෙවණ*
*හුදු බැතින් දිවි හිමින්*
*සුරකිම්හ*

**කර්නල් කේ.පී.විමලසේන**
විදුහල්පති
ධර්මපාල විද්‍යාලය, පන්නිපිටිය.



## ආදි ශිෂ්‍ය සංගමයේ ගරු, විධායක සභාපතිතුමාගේ සුභාසිංශන .....

පළමුව ''පෙරමග" දශක කණ්ඩායමේ දෙවන වරට නිකුත් කරනු ලබන ''පෙරමග පුවත් සගරාව " වෙනුවෙන් මෙම වර්ෂයේ විධායක සභාපති ලෙස මා හට සුභාසිංශන එක්කිරීමට ලැබීම පිළිබඳ ඉතා සතුටට පත්වෙමි. එනම් මා ද ආදි ශිෂ්‍ය සංගමයේ 2001-2020 දශකයට අදාළ පෙරමග දශක කණ්ඩායමේ ආරම්භක සාමාජියෙකු වන බැවිනි.

ආරම්භක පෙරමග සාමාජිකයෙකු ලෙස පෙරමග කණ්ඩායම විසින් පාසලට සිදු කළ සේවාවන් , සාමාජික සමරු සටහන්, විශේෂ සන්ධිස්ථානයන් පිළිබඳ තොරතුරු එක් තැනකට ගොනු කොට සගරාවක් ලෙස සාමාජිකයන් වෙත ලබාදීමෙන් මා ඇතුළ සියලු සාමාජිකයින් තුළ අප කණ්ඩායම පිළිබඳ ඇතිවන්නේ ඉමහත් වූ ආඩම්බරයකි.

පෙරමග සභාපතිතුමා ඇතුලු කාරක සභිකයින්ට දෙවන වරට ද මෙම සගරාව එළිදක්වීම උදෙසා දරන ඔවුන්ගේ නොපසුබට උත්සාහයට නැවතත් ස්තුති කරන අතර මෙම කර්තව්‍ය අඛණ්ඩව සිදුකර ගෙන යාම සඳහා ඉදිරි වර්ෂ වලදී පත්වන කමිටු සාමාජිකයන් වෙත ද ශක්තිය හා ධෛර්යය ලැබේවායි මම ප්‍රාර්ථනා කරමි.

**ජීවන් ප්‍රියදර්ශන යාපා**
විධායක සභාපති (2020-2021)
ආදි ශිෂ්‍ය සංගමය



## ආදි ශිෂ්‍ය සංගමයේ ගරු, ප්‍රධාන ලේකම්තුමාගේ සුභාසිංශන .....

ආදි ශිෂ්‍ය සංගමයේ 2001-2010 දශකය තුළ සිටින ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඒකරාශි වී සිටින "පෙරමග" දශක කණ්ඩායම විසින් නිකුත් කරන ''පෙරමග පුවත් සඟරාව " වෙනුවෙන් සුභාසිංශන එක් කරන්නේ ඉමහත් සතුටිනි.

ආදි ශිෂ්‍ය සංගමයේ වත්මන් තරුණ ජවයට හිමිකම් කියන පෙරමග දශක කණ්ඩායම කොවිඩ් - 19 වසංගතය හමුවේ සමස්ත ලෝකයා, ශ්‍රී ලංකාව, පාසල හා ආදි ශිෂ්‍ය සංගමය ගොදුරු වූ අවස්ථාවක දී ගත වූ වසර තුළ පාසල හා ආදි ශිෂ්‍ය සංගමය වෙනුවෙන් අමිල මෙහෙයක් ඉටු කිරීම පිළිබඳව මාගේ ප්‍රසංශාවත්, ස්තුතියත් පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

ඒ වෙනුවෙන් පෙරමග දශක කණ්ඩායමට 2020 වසරේ නායකත්වය දුන් සුලක්ෂණ විදුරංග සොයුරා ඇතුළු සියලු විධායක කමිටු සභිකයින්ටත්, සියලුම සාමාජික සොයුරු සොයුරියන්ටත් ආදි ශිෂ්‍ය සංගමයේ ගෞරවය පුද කරමි.

පාසල හා ආදි ශිෂ්‍ය සංගමය වෙනුවෙන් ඉදිරිපත් වන ඉල්ලීම් වලදී එය ඉටුකිරීමට කවදත් පෙරමග ගන්නා පෙරමග දශක කණ්ඩායම ගත වූ වසරේදී ද ලබාදුන් මූලික දායකත්වයන් අතර විද්‍යාලයේ ප්‍රධාන ශාලාව වෙනුවෙන් දක් වූ දායකත්වය, කොවිඩ් වසංගතය හමුවේ ලබාදුන් දායකත්වය මෙන්ම, ආදි ශිෂ්‍ය සංගමයේ දම්පල් සවිය හරහා කොවිඩ් පළමු රැල්ලේ අපේම පාසල් ප්‍රජාවේ පවුල් 150 කට පමණ සහන සැලසීමේදී ලබාදුන් මූල්‍ය හා ශ්‍රම දායකත්වය පිළිබඳව විශේෂයෙන් සිහිපත් කළ යුතුය.

ආදි ශිෂ්‍ය සංගමයේ අනාගතය භාර ගැනීමට තරුණ ජවය ඇති නායකයන් රැසක් සිටින පෙරමග දශක කණ්ඩායම පාසලට, ආදි ශිෂ්‍ය සංගමයට සාධනීය සලකුණක් වනු ඇතැයි සැමවිටම බලාපොරොත්තු වෙමි.

**දුමින්ද සංජීව බාලසූරිය**
ප්‍රධාන ලේකම් (2020-2021)
ආදි ශිෂ්‍ය සංගමය

# පෙරමග දශක කණ්ඩායම
# විධායක සභාව 2020 / 2021



පළමු පෙළ වමේ සිට
සංස්කාරක - නිශාදි රුක්ෂාණි , උප භාණ්ඩාගාරික - තිළිණි ශ්‍යාලිකා, භාණ්ඩාගාරික - ශිවන්ත කොස්වත්තගේ, හිටපු සභාපති - බුද්ධික රොෂාන් උප සභාපති - චරිත චන්දන පෙරේරා , ප්‍රධාන උප සභාපති - පෙවින්ද බැලගම, සභාපති - සුලක්ෂණ විදුරංග, ලේකම් - දිනේෂා ජයමාන්න, ප්‍රධාන උප ලේකම් - ධනංජ ඇල්විටිගල, උප ලේකම්වරුන් - චමිඳු විජයවර්ධන, ජේ. ඩබ්. එන් සාලින්ද, සංවිධායක - යසන්ත ඉන්දිවර, දිවි වාර්ෂික සම්බන්ධීකාරක - රසික මධුසංක

දෙවන පෙළ දකුණේ සිට
කාරක සභිකයන් : ඩබ්.ඒ.ඩී. ගයනි කෞෂල්‍යා, ඩබ්ලිව්.ඒ.ටී. මදුරංගී, සුමුදු ගීගනගේ, ක්‍රිෂාන්ති සපුකොටනගේ, උප සංවිධායක - හර්ෂ රණසිංහ, තරිඳු පෙරේරා, රමේෂ් මාරසිංහ, මහවත්තගේ රෝෂන, රුවන් කුමාරගේ, තිළිණ භාග්‍ය අබේසේකර

තෙවන පෙළ වමේ සිට
කාරක සභිකයන් : අප්සරා මධුවන්ති, අරුණි ලියනගේ, දිලිනි ලංකිකා ලියනගේ, ඉසුරු උදාර උඩුවන, රුක්ෂාන් සමරවීර, අධීෂ තරිඳු මාලිංග, කල්පිත කෝදාමුල්ල, ගීතක පෙරේරා, මේඛලා නදීශානි ප්‍රනාන්දු, චරිතා සෙනවිරත්න

# ''පෙරමගින් පෙරමගට'' සමාජ මෙහෙවර

දම්පල් විදු මැණියන් තුරුලේ මීට වසර 14 කට පමණ පෙර, එනම් 2007 මැයි මස 15 දින මෙලොව එළිය දුටු ධර්මපාල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයට අනුබද්ධ පෙරමග දශක කණ්ඩායම බිහිවීමේ මූලික අරමුණ වූයේ පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ දියුණුව හා ආදි ධර්මපාලියන්ගේ සුභසාධනයයි. නමුත් එදා රෝපණය කල කුඩා පැළය වර්තමානය වන විට අතුදා දලුදා රෝපණය වී මුල් හොඳින් ශක්තිමත් වී පරිණත වෙමින් පවතී.

තම පාසලේ දියුණුව හා සාමාජික සුභ සාධනය පමණක් අරමුණු කරගෙන ආරම්භ කළ අප සංගමය තම දැත් සමාජ සුභසාධනය දෙසට දිගු කරන්නේ හිරිමල් විය පසු කිරීමටත් ප්‍රථමයෙනි.



එනම් 2014 වර්ෂයේදී මධ්‍යම පළාතේ මාතලේ ප්‍රදේශයේ පිහිටි ඉතා දුෂ්කර ගම්මානයක් වන කඹරව ගම්මානයේ පිහිටි කණිෂ්ඨ විද්‍යාලයේ දූවා දරුවන්ට තම අධ්‍යාපන කටයුතු සිදු කිරීමට අවශ්‍ය පාසල් උපකරණ හා සංගීත භාණ්ඩ ලබා දෙමින් ඔවුන්ගේ අධ්‍යාපන හා කුසලතා මට්ටම ඉහල නැංවීමට දැක්වූ දායකත්වය මගිනි.



එසේ දායකත්වය දක්වා වසරක් පමණ ගතවන විටදී මහා වරුසාවක් ඇද වැටී රටේ විවිධ ප්‍රදේශවලට ගංවතුර ගලා මහත් පීඩාවන් ගෙන දෙන වකවානුවක් උදා විය.

ඒ මොහොතේදී පෙරට බට පෙරමග තෝරාගත් රත්නපුර දිස්ත්‍රික්කයේ දෙහිඕවිට ප්‍රදේශයේ පිහිටි අටලුගම මායාදුන්න කනිෂ්ඨ විදුහල එවැනි දුෂ්කර පාසලකි.



එහි ඉගෙනුම ලැබූ දූවා දරුවන් සතුව තිබූ සියලුම පොත් පත් හා පාසල් උපකරණ ඒ වන විටත් ගං වතුරට ගසාගෙන ගොස් ය. තෙත බේරෙන පොත්පත් ඇතැතිව සෝසුසුම් හෙළන දරුවන්ට පිළිසරණක් වන්නට පෙරමග කණ්ඩායම තීරණය කරන ලදී. එහිදී ඔවුන්ට අවශ්‍ය පොත්පත්, ක්‍රීඩා උපකරණ, සපත්තු, බෑග් ආදී පාසල් යාමට අවශ්‍ය සියලුම ද්‍රව්‍ය අප

සංගමයේ සාමාජිකයන්ගේ පෞද්ගලික මූල්‍ය පරිත්‍යාග මගින් එම දරුවන් වෙත පිරිනැමීමට හැකිවීම මේ මොහොතේ සිහිපත් කරන්නේ හද පිරි සතුටිනි.



කෙසේ වෙතත් අප රටේ පවතින කාලගුණික විපර්යාස මත සිදුවන මෙවැනි විපත්වලට මුහුණ දුන් තවත් අසරණ දූවා දරුවන් සිටින පාසල් කිහිපයකටම, ඊට පසු වසර කිහිපයකදීම පෙරමග සාමාජිකයන් උදවු කිරීමට තීරණය කරන්නේ අප සතු සාමාජීය යුතුකම තවත් පුළුල් කරමිනි. පෙර වසරවල මෙන්ම පාසල් උපකරණ ලබාදෙමින් මාතර දිස්ත්‍රික්කයේ පිහිටි දුෂ්කර පාසල් ත්‍රිත්වයක් සඳහා ආධාර ලබා දීම අමතක කල නොහැක.



කොළඹ දිස්ත්‍රික්කය තළ පිහිටි අප රටේ ප්‍රධාන රජයේ රෝහලක් වන දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ පැවති අඩුපාඩුවක් ලෙස හඳුනාගත් X-Ray කාඩ්පත් බහාලුම් වල හිඟතාවය පිළිබඳ දැනුවත් වූ අප සංගමයේ සාමාජිකයින් එම අවශ්‍යතාවය සම්පූර්ණ කර දීමට ඉදිරිපත් වූයේ පෙරමග සමාජ මෙහෙවර තවත් පුලුල් කරමින්ය. එම පරිත්‍යාගය සමස්ත රෝහල් කාර්ය මණ්ඩලයේම පැසසුමට ලක් විය.



මෙසේ කාලය ගත වෙත්ම එවකට අප විද්‍යාලයේ විදුහල්පතිතුමා වූ ඔෂාර පණ්ඩිතරත්න මහතා අප සංගමය වෙත සිදු කළ ඉල්ලීමකට අනුව අප පාසලේ ඉගෙනුම ලබන විවිධ අංශ වලින් දක්ෂතා දක්වන, නමුත් දැඩි ආර්ථික දුෂ්කරතා වලින් පෙළෙන දූවා දරුවන් සඳහා 2019 වසරේ සිට මූල්‍යමය ශිෂ්‍යත්වයන පිරිනැමීමට සංගමය විසින් තීරණය කරන ලදී. 2019 වසරේ සිට මේ දක්වා අඛණ්ඩව මෙම ශිෂ්‍යත්වය ලබා දීමට හැකිවීම පිළිබඳ අපට ඇත්තේ නිහතමානී ආඩම්බරයකි.

මෑත වකවානුවේදී ලෝකයම මුහුණ පා සිටින දරුණුතම ව්‍යසනකාරී තත්ත්වය වනුයේ කොවිඩ්19 වෛරස ව්‍යාප්තියයි. ලෝකයේ අනෙකුත් ප්‍රධාන රටවලට සාපේක්ෂව අප රට තුල කොරෝනා ප්‍රථම රැල්ල (වෛරස ව්‍යාප්තිය) පාලනය කිරීමට හැකියාව ලැබුනේ වෛරසයේ බලපෑමට ලක් වූ ප්‍රදේශවල සංචරණය සීමා කිරීම සඳහා ඇඳිරි නීතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙනි. එසේ මාස කිහිපයක් බලපැවැත්වූ ඇඳිරිනීතියේ බලපෑම හේතුවෙන් සමාජීය වශයෙන් ප්‍රශ්න රැසකට මුහුණ දීමට ජනතාවට සිදු විය. දෛනික ආදායම් ලබන විශාල පිරිසක් අප පාසලට ආසන්න ප්‍රදේශ වලද පදිංචිව සිටිති. එම පවුල් ඒකක වල දූ දරුවන් අධ්‍යාපනය ලබා ගැනීම සඳහා පැමිණෙන්නේ අප පාසලටය. එම දරු පවුල් වලට අත් විඳීමට සිදුවී ඇති අපහසුතාවය තේරුම්ගත් ධර්මපාල විද්‍යාලයීය අදිශිෂ්‍ය මව් සංගමය එම පවුල් ඒකක පිළිබඳ සොයා බලා ඔවුන්ට වියළි ආහාර මල්ලක් ලබා දීමට තීරණය කරන ලදී.



දරුවන් කීපදෙනෙකු සමඟ නිවසටම කොටුවී අසරණ වී සිටින පවුල් ඒකක 150 කට අධික සංඛ්‍යාවකගේ විස්තර පාසලෙන් හා විවිධ පුද්ගලයන්ගෙන් මව් සංගමයට ලැබී තිබුණි. එම තොරතුරුවල සත්‍ය අසත්‍යතාවය පරීක්ෂා කිරීමෙන් අනතුරුව එක් පවුලක් සඳහා රු 5000/- වැඩි වටිනාකමකින් යුතු අත්‍යවශ්‍ය ද්‍රව්‍ය



විශාල ප්‍රමාණයක් අඩංගු බෑගයක් ලබා දීම ආදි ශිෂ්‍ය සංගමය විසින් ආරම්භ කරන ලදී. එම ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා පෙරමග සාමාජිකයන් විසින් සිදුකළ මූල්‍යමය දායකත්වයන් මෙහිදී සිහිපත් කළ යුතුය. සමාජයේ පැවති කොරෝනා වෛරස තත්ත්වයට බිය නොවී සෞඛ්‍ය ආරක්ෂණ පිළිවෙත් අනුගමනය කරමින් ආහාර මලු සකස් කිරීමටත් ඒවා අදාල නිවෙස් වලට බෙදා හැරීමටත් පෙරමග සාමාජිකයන්ගේ දායකත්වය නොඅඩුව ලැබුනි. පසුගිය 2020 වසර තුල සිදු කළ විශාලතම සමාජ සුභ සාධන සේවාව ලෙස එයද සිහිකොට තබමි.



එමෙන්ම 2020/2021 පරිපාලන වර්ෂය සඳහා පත් වූ පෙරමග විධායක කමිටුව විසින් සාමාජික සුභ සාධනය අරමුණු කොටගෙන සාමාජිකයෙකුගේ , හෝ ඔහුගේ හෝ ඇයගේ සමීපතමයකුගේ (කාලත්‍රයාගේ / දරුවෙකුගේ) අවමංගල්‍යය අවස්ථාවකදී යම් මූල්‍යමය පරිත්‍යාගයක් සිදු කිරීමට යෝජනා සම්මත කරගන්නා ලද අතර ඉදිරි වර්ෂ වල පත්වන විධායක කමිටු එම කමිටු වල තීරණ මත එකී පරිත්‍යාගයන් වල වටිනාකම් තීරණය කරනු ඇත. මේ වසරේදී එසේ අප අතරින් වෙන් වූ පෙරමග සාමාජිකයන් දෙදෙනෙකු උදෙසා මූල්‍යමය පරිත්‍යාගයන් සිදු කර තිබේ.

මෙවැනි සමාජ සුභ සාධන සේවාවන් රාශියක් පෙරමග ආරම්භක වකවානුවේ සිට මේ දක්වා අඛණ්ඩව සිදු කිරීමට හැකියාව ලැබුනේ අප කණ්ඩායම තුල එදා සිට පැවත එන අන්‍යෝන්‍ය විශ්වාසය මත ගොඩ නැගුණ එකමුතු කම මතයි. එම ශක්තිය ඉදිරියටත් වර්ධනය කර ගනිමින් තව තවත් සමාජ සුභ සාධන කටයුතු සිදු කරමින් මුළු මහත් සමාජයටම ආදර්ශයක් හා ආරක්ෂාවක් සපයන යෝධ රුක්ෂයක් වී වැජඹීමට ධර්මපාලීය ආදි ශිෂ්‍ය පෙරමග දශක කණ්ඩායමේ සාමාජික සාමාජිකාවන්ට වාසනාව, ශක්තිය, ධෛර්ය උදාපත් වේවායි මම එක සිතින් ප්‍රාර්ථනා කර සිටිමි.

චමිඳු විජයවර්ධන

# දම්පල් අභිමානයේ ප්‍රෞඪ සළකුණ
# දම්පල් කෞතුකාගාරය සහ අභිලේඛනාගාරය




වර්ෂ 2000 ක් වූ ජනවාරි මස එක් පැහැබර උදෑසනක ධර්මපාල රම්‍ය විදුපියසට පළමු වරට පා තැබූ දිනය ජීවිතයේ ඉතා තීරණාත්මක සන්ධිස්ථානයක් ලෙස තවමත් මගේ මතකයේ නිධන්ව ඇත. ප්‍රධාන ගේට්ටුවෙන් ඇතුල් වන විටම දර්ශනය වූ මලින් පිරී ගිය යෝධ සල් ගස, හයිලෙවල් මාර්ගයට සමාන්තරව වවා තිබූ අරලිය ගස් පේළිය, ක්‍රීඩා පිටිය ආසන්නයේ තිබූ රතු මලින් පිරී ගිය මැයි ගස මේ අති රමණීය දම්පල් මෑණියන්ගේ සුන්දරත්වය මොනවට කියා පෑ හැටි මට තාමත් මතකය. කුඩා පාසලකින් ශිෂ්‍යත්වය සමත්ව පැමිණි මා මේ ලද නවමු අත්දැකීමෙන් ඇවිස්සී ගිය කුතුහලයෙන් යුතුව හාත්පස බලන ලද අතර එහි සුන්දරත්වය හා විශාලත්වය එදවස මගේ කුඩා සිත වසඟ කිරීමට සමත් විය. එදින මා නිවසට පැමිණියේ ශිෂ්‍යත්වය සමත්ව ධර්මපාලයට පැමිණි සියලු දරුවනට ලැබුණු ධර්මපාල "ප්‍රතිරාව" සඟරාව ද අතැතිවය. එදින පටන් ප්‍රතිරාව සඟරාව මා විසින් කිහිප වරක් කියවා ඇති අතර එය අළුතින් ධර්මපාලයට පැමිණෙන්නෙකුට දම්පල් මාතාව පිළිබඳව අභිමානවත් හැඟීමක් ඇතිකරලීමට බොහෝ සෙයින් දායක වූ බව මාගේ හැඟීමයි. පාසලේ අතීත ශ්‍රී විභූතිය, ආදි ගුරුවරුන් සහ ආදි සිසු සිසුවියන් පිළිබඳව මිහිරි මතක රාශියකින් එම සඟරාව සමන්විත විය. දම්පල් මෑණියන්ට මහත් සේ ආදරය කරන්නට, ගෞරව කරන්නට පළමු පන්නරය මසිතෙහි පිළිසිඳ ගැනුණේ එහි ඉතිහාසය පිළිබඳ විස්තරාත්මකව දැන ගැනීමෙන් පසුව බව විශ්වාසයෙන් යුතුව මෙහිලා සඳහන් කළ හැකිය.



කිසියම් රටකට හෝ ජාතියකට හෝ ආයතනයකට හෝ පුද්ගලයෙකුට හෝ අභිමානවත් ඉතිහාසයක් තිබේ නම් එය මහඟු වත්කමකි. පාසලක් පිළිබඳ දැනෙන අභිමානයද එසේය. පාසලේ දැනට ශිල්ප හදාරන දරුවනට සේම පාසලෙන් ඉවත් වූ අපට ද එම අභිමානවත් ඉතිහාසය ගෙන එන්නේ මහඟු ශක්තියකි. අනගාරික ධර්මපාලතුමාගේ පාදස්පර්ශයෙන් පූජනීයත්වයට පත් වූ ධර්මපාල පුණ්‍ය භූමියෙහි ඉතිහාසය සුන්දර තරමටම කටු කොහොල් මැදින් ජයග්‍රහණයේ මංපෙත් සොයා පැමිණි දුෂ්කර එකකි. එම කටු කොහොල් පරයා කිරුළු පලඳින්නට දරදිය ඇදි, දුක් කඳුළු හෙළු ආදි විදුහල්පතිවරුන්, ආදි ගුරුභවතුන්, ආදි සිසු සිසුවියන් හා දෙගුරුන් සියළු දෙනාටම වර්තමාන සිසු දරුවනගේ ආචාරය හිමිවිය යුතුමය. ඒ අද ඔවුන් 'මම ධර්මපාලයේ සිසුවෙක්මි' යි අභිමානයෙන් යුතුව පවසන්නට මූල බීජ වපුරන ලද්දේ ඔවුන් නිසාවෙනි.



යමෙකු තම ජාතියෙහි ඉතිහාසය නොදනී නම් ඔහු ඉතා අවාසනාවන්තයෙකි. එලෙසින්ම ධර්මපාලයේ ඉතිහාසය කෙබඳු ද යන්න පිළිබඳ කිසිත් නොදන්නෙකු තුළින් සැබෑ ධර්මපාලියෙකු බිහි නොවේ. එසේ නම් ඉතිහාසය නැවත වර්තමානයට ගෙන ආ යුතුය. ධර්මපාලයේ ඉගෙන ගන්නා සෑම දරුවෙකුම තමාගේ මුල් පිළිබඳව දැනගත යුතුය. ඉතිහාසය දැන වර්තමානයේත් අනාගතයේත් එක සේ තම දෙවෙනි මවට ආදරය කළ යුතුය.

එවැනි උදාරතර අරමුණක් පෙරදැරිව ගොඩනගන ලද්දකි, 'ධර්මපාල කෞතුකාගාරය සහ අභිලේඛනාගාරය'. 2019/2020 පෙරමග දශක කණ්ඩායම සිය ප්‍රධාන මූල්‍යෝත්පාදන ව්‍යාපෘතිය වූ අති සාර්ථක වායෝ සංගීත ප්‍රසංගයෙන් උපයන ලද ලාභයෙන් විද්‍යාලයීය ප්‍රධාන ශාලාව හා ප්‍රවේශ ශාලාව නවීකරණය කිරීමට කටයුතු සම්පාදනය කරන ලදී. මෙහිදී ප්‍රවේශ ශාලාවෙහි දොරටුව පිළිබඳව ද යමක් සඳහන් කළ යුතුය. බෙහෙවින් අබලන් තත්ත්වයේ තිබුණු එය එහි මුල් නිර්මාණයට කිසිසේත් ම හානි නොවන පරිදි ගෘහ නිර්මාණ ශිල්පියෙකුගේ උපදෙස් මත වෘත්තිමය නිපුණයන්ගේ හැකියාවෙන් ප්‍රතිෂ්ඨාපනය කිරීමට හැකි විය. මෙසේ පිළිසකර කටයුතු කඩිනමින් සිදුවද්දී ප්‍රවේශ ශාලාව ආසන්නයේ පිහිටි කුඩා ඉඩකඩක් ඉතිරිව තිබූ අතර ප්‍රධාන සැලසුම් ප්‍රකාරව එහි කෞතුකාගාරයක් නිම වීමට යෝජනා වී තිබුණි. ඒ සඳහා පුරෝගාමී වී කටයුතු කිරීමට පෙරමග කණ්ඩායමේ එවකට සභාපති වූ බුද්ධික රොෂාන් මහතා ප්‍රමුඛ විධායක කමිටුව විසින් ඒකමතිකව තීරණය කරන ලදී. බැලූ බැල්මට කුඩා ව්‍යාපෘතියක් ලෙස පෙනුණ ද එතුලින් ඉස්මතු කරවන දම්පල් අභිමානය සහ නිරන්තරයෙන් එයට එකතු කළ යුතු අංගෝපාංග සමඟ ගත් කළ මෙය පෙරමග කණ්ඩායමට තවත් එක් යෝධ ව්‍යාපෘතියකි.

කෞතුකාගාරය පිළිබඳ සංකල්පය ගොඩනැගි දා පටන් ඊට උර දුන් කිහිප දෙනෙකු පිළිබඳ මෙහි ලා සඳහන් කළ යුතු ය. ප්‍රථමයෙන්ම නිබඳවම අදහස් සහ උපදෙස් දෙමින් අප දිරිමත් කළ එවකට විදුහල්පති ඔෂාර පණ්ඩිතරත්න මහතා ප්‍රමුඛ ආදි ශිෂ්‍ය සංගමයේ විධායක සභාපති නෝමන් රණසිංහ මහතා, ලේකම් දුමින්ද බාලසූරිය මහතා, නියෝජ්‍ය සභාපති ජීවන් යාපා මහතා සහ භාණ්ඩාගාරික චරිත් ලියනගේ මහතා ඇතුළු ආදි ශිෂ්‍ය මව් සංගමයේ විධායක සභාවට ස්තූතිවන්ත විය යුතු ය. එසේම මෙහිදී ඉතා විශාල කාර්යභාරයක් ඉටුකළ දිනේන්ද්‍රපාල සිරිවර්ධන ගුරු මහතා ද අමතක කළ නොහැකි චරිතයකි. එතුමා මෙහි ප්‍රධාන සම්පත් දායකයා වේ. එතුමා විසින් දීර්ඝ කාලයක් තිස්සේ සුරක්ෂිතව තබා ගන්නා ලද විද්‍යාලයේ ඉතා පැරණි ඡායාරූප, පුවත් පත්‍රිකා වල කොටස් යනාදිය ලබාදීමෙන් සහ ඒ එක එකක් පිළිබඳව ඉතා පැහැදිලි විස්තර සපයමින් එතුමා ලබා දුන් සහය මෙපමණකැයි කිව නොහැක. තවද ආදි ශිෂ්‍යාවන් මෙන්ම ආදි ගුරුභවතුන් දෙපළක් වන යමුනා ආරියසිංහ සහ සීතා විජේසේකර යන ගුරුමෑණිවරුන් ද තමන් සතු ඒ අගනා පාසල සම්බන්ධ පැරණි සිහිවටන කෞතුකාගාරයට පරිත්‍යාග කිරීමට නිර්ලෝභී වූහ. එමෙන්ම මෙහි ලා පෙරමග සාමාජික සාමාජිකාවන්ගේ කැපවීම ද මතක් කළ යුතුමය. දිවා රෑ නොබලා මහන්සි වෙමින් මේ උදාරතර කාර්යය

යථාර්තයක් බවට පත් කර ගැනීමට බොහෝ දෙනෙක් දහඩිය මහන්සියෙන් කැප වුණහ. ඔවුනටද සියළු දෙනාගේ හෘදයාංගම ස්තුතිය හිමිවිය යුතුය.

වර්ෂ 2020 ක් වූ පෙබරවාරි මස 23 වන ඉරු දින පෙරමග දශක කණ්ඩායමට සදා අනුස්මරණීය දිනයක් වනු නොඅනුමානය. එක් පසෙකින් පෙරමග 14 වන මහා සභා රැස්වීම පැවැත්වීමට නියමිතව තිබුනේ එදිනටය. අනෙක් පසින් වැඩ නිම කළ අභිනව ප්‍රවේශ ශාලාව සහ කෞතුකාගාරය සහ අභිලේඛනාගාරය පාසලට භාර දීමේ උත්සවය යෙදී තිබුණේත් එදිනටය. පූජ්‍ය රේරුකානේ ඥාණිස්සර ස්වාමීන් වහන්සේ, එවකට විදුහල්පති ඔෂාර පණ්ඩිතරත්න මහතා, ආදි ශිෂ්‍ය සංගමයේ ගරු විධායක සභාපති නෝමන් රණසිංහ මහතා, ගරු ලේකම් දුමින්ද බාලසූරිය මහතා ඇතුළු ආදි ශිෂ්‍ය සංගමයේ විධායක සභික මහත්වරුන් සහ මහත්මීන්, දිනේන්ද්‍රපාල සිරිවර්ධන ගුරු මහතා, යමුනා ආරියසිංහ ගුරුමැණියන්, සීතා විජේසේකර ගුරුමැණියන්, පෙරමග සාමාජික සාමාජිකාවන් ඇතුළු විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් උත්සවය ආරම්භ වූ අතර ප්‍රවේශ ශාලාව විවෘත කරන ලද්දේ පූජ්‍ය රේරුකානේ ඥාණිස්සර ස්වාමීන් වහන්සේ විසිනි. ආගමික වතාවත් සහ පිළිගැනීමේ සහ සුභාශිංසන කතා වලින් අනතුරුව කෞතුකාගාරයේ සමරු ඵලකය සියලුම පෙරමග සාමාජික සාමාජිකාවන් නියෝජනය කරමින් 2019/2020 පෙරමග විධායක කමිටුවේ ගරු සභාපති බුද්ධික රොෂාන් මහතා සහ ගරු ලේකම් ගයානි කොස්වත්තගේ මහත්මිය විසින් විවෘත කරන ලදී. අනගාරික ධර්මපාල පිළිරුවට මල් මාලය පළඳවා පුෂ්පෝපහාර පවත්වන ලද්දේ නෝමන් රණසිංහ ගුරු පියාණන් විසිනි. ධර්මපාල අභිමානවත් ඉතිහාසය නැවත වර්තමානයට ගෙන ඒමට පෙරමග කණ්ඩායම දැරූ උත්සහය සියලු දෙනාගේම පැසසුමට භාජනය විය. සියලු පෙරමග සාමාජික සාමාජිකාවනට එය සැමදා මහත් ගෞරවයක්ම වනු ඇත.




මෙසේ පාසලට භාරදුන් කෞතුකාගාරය සහ අභිලේඛනාගාරය පිළිබඳ ව්‍යාපෘතිය ඉන් අවසන් වුණි යැයි යමෙකු සිතන්නේ නම් එය එසේ නොවන බව පාඨක ඔබ සැමට මෙහිලා සඳහන් කරනු කැමැත්තෙමි. ඒ එසවූ ආරම්භක පියවර තව බොහෝ දුර රැගෙන යා යුතුය. නිරන්තරයෙන් සංවර්ධනය විය යුතුය. අළුත් විය යුතුය. තව තවත් කෞතුක භාණ්ඩ, ඡායාරූප, සිහිවටන, පත්‍රිකා, සඟරා යනාදීන් සොයා කෞතුකාගාරය පොහොසත් කළ යුතුය. තම තමන් පෞද්ගලිකව සුරක්ෂිතව තබාගන්නා ලද පැරණි සිහිවටන නව පරම්පරා ගණනාවකටම දැකගනු පිණිස කෞතුකාගාරයට පරිත්‍යාග කර ඒවා සංරක්ෂණය කිරීමට ඉඩ හසර ලබා දීම සියලුදෙනාගේම යුතුකමක් ලෙස සැලකිය යුතුය. පෙරමග දශක කණ්ඩායම මෙහිදී සැලකිය යුතු වැඩ කොටසක් ඉටු කරන අතරම ඊට පෙරගමන්කරු ලෙස ක්‍රියාකරනු ලබයි. ඉදිරියට පත්වන සියලුම පෙරමග විධායක කමිටු ඒ සඳහා ක්‍රියාකරනු ඇත.

ඉතිහාසය අමතක කළ නොහැක. ඉතිහාසය වෙනස් කළ නොහැක. එහෙත් ඉතිහාසය හදවතේ ශේෂව පවතින තාක්කල් වර්තමානය සහ අනාගතය ඒ අනුව හැඩගස්වා ගත හැකිය. දම්පල් මැණියන් අභිමානවත් ඉතිහාසයකට හිමිකම් දරයි. වර්තමානයේ අපි එම ඉතිහාසය සාක්ෂි සහිතවම ඔප්පු කළ සාක්ෂිකරුවන් වෙමු. එම ඉතිහාසය කැළලක් ඇති වීමට නොදී රැක බලා ගැනීම අනාගතයේ අප සතු කාර්යයයි. ඒ සඳහා උර දෙමින් අසීමිත කැප කිරීමක් කරන සියලු දෙනාටම මෙම ලිපිය ආශිර්වාදයක්ම වේවා යන්න මාගේ ඒකායන ප්‍රාර්ථනයයි.



දිනේෂා ජයමාන්න





# Dr. Hemantha Perera:
## A Gifted Healer And A Proud Palian

***Compiled by Kalpitha Kodamulla***

There are people who have changed the world. There are people who have healed this world. Most importantly, there are people who decide to keep this world alive with good thoughts, commitment and real dedication. In this article, we spoke with a gentleman who has been a strength to our country, to our health sector as well as to our school. He is Dr. Hemantha Perera, consultant obstetrician & gynaecologist with very vast experience and expertise, not only in health care but also about various important segments in life.

### 1.) My childhood

I was born in 1955. Both my parents were school principals. I was the last of a family of for children. My eldest sister was a teacher in Dharmapala Vidyalaya. All four of us studied at Dharmapala Vidyalaya.

My father, Mr. U.D. Perera was a leading musician of the Gramophone era and is remembered as the lyricist of many vintage songs like නිල් අහස් තලේ, නාමෙ නොදිරනා, රජ සඟබෝ, මුණි නන්දන සිරිපාද, කරුණා මුහුදේ and සිළුමිණි සෑය වඳිමි.

I had a very relaxed and as memorable childhood in Handapangoda, a rural village between Padukka and Ingiriya. It was an enchanting village with waterways and woodlands. We would roam freely in the village where every villager was known to each other and was helpful and friendly. There were no scares for children from adults those days. Those villagers were extremely rich in every aspect of life, except money. I was privileged to have been in their company during my grooming.

My first school was Handapangoda Maha Vidyalaya which is much developed now. I began schooling earlier than most as I used to follow my mother, who was the headmistress of the junior school. This gave me an advantage of age over others up to my university entrance.

Schooling or studying had been stress-free for every child at that time. Education was not a rat race like these days, and the parents were not focused only on making their children pass exams to become doctors and engineers. Schooling was fun, and after school, life was even more fun as it was free of tuition. The teachers were very relaxed and were like parents to us.

My parents too never told me to become a so and so professionally but only encouraged us to become quality citizens. This too, has been my life motto as a parent.

### 2.)Memories with Dharmapala Vidyalaya, Pannipitiya

I joined the school in 1965 as a grade 4 student. I used to get up around four o'clock with all my siblings as we had to catch the 5.45 bus from Ingiriya to Colombo. This journey was also fun as all the commuters were known to each other.

Apart from studies, I really liked the environment and culture of Dharmapala Vidyalaya, being one of the most beautiful schools in the country. Its green environment with trees which carpeted the ground in different hues during the flowering season, play ground, adjoining paddy fields, the serene Buddha statue in the shrine room, Araliya tree lined frontage, old yet grand main hall and the class rooms were all so unique and are still etched in my memory. Since its inception, our school had a rich heritage, and we were expected to honour and maintain the principles of Anagarika Dharmapala. We were made to understand the responsibilities of a Palian from a very young age.

Being the largest mixed school in the island, Dharmapala Vidyalaya taught the values of gender equality in us from a very young age. We learnt to honour others as brothers and sisters. This has stood me in good stead later when I joined the university and also in my professional life. I think all schools must be of the mixed type as in developed countries if we are to remove gender bias in life.

My teachers throughout my school life were great role models and what I'm today is due to their untiring professionalism. I can still remember teachers conducting extra classes for us after school and during weekends, free of charge, of course. We were fortunate to have some of the best teachers in the country. Their sole target was to make us good citizens with a good education. Money was not on their agenda. Their life satisfaction was to see us doing well in our lives. I'm ever grateful to them.

English as a language was given a high priority right from the lower grades. This helped not only for studies during school but also for my university education and beyond.

We used to watch cricket matches through Friday noon to Saturday evening. Seated under the trees on the perimeter of the school ground, we would cheer every ball. I played only softball cricket while many of my classmates were in the first eleven.

With some friends, I started playing

badminton using the netball court as there was no separate playing area. I am glad that the "Araliya" Past Pupils Group, to which I belong pioneered the development of indoor badminton courts for the school.

The annual sports meet was a carnival time for all the students. Preparation for the meet brought all the students together like a family. We would stay overnight to prepare house tents. I also participated in some events though hardly won any, which was not surprising considering my physique.

I was more involved in the science society than sports. I used to teach my classmates in the afternoons on subjects for which we did not have teachers. I had to read my elder sister's books and learn before this exercise. This helped my friends as well as me in passing the exams.

I met my life partner also at school, like many others who have done so. The environment of the school was very conducive to such romantic encounters.

Sri Lanka had only two medical schools at that time. 125 students entered Colombo, and another 75 entered Peradeniya. I passed advanced level with the best results of the school and entered the Colombo Medical Faculty. There were six of us who entered the medical faculties that year which probably is a record for our school up to date.

My medical faculty life was delightful. The foundation which was given by my school, both in examination subjects as well as in the English language, held me in good stead in the university, among other students who came from much higher social strata. My teachers included the best in the country and were the likes of Prof. Carlo Fonseka. I passed as a doctor in 1979 with honours.

After graduation, I trained in Colombo and later worked at the Apeksha hospital, then known as the Cancer Hospital. During this time, I joined the Army in the rank of a captain as a volunteer doctor. There were hardly any doctors in the Army at that time. I worked at Palaly and other areas in the north and east as well as in Colombo during the infamous 1983 riots.

After that, I went in to postgraduate studies and ended up as a specialist in Obstetrics and Gynaecology, passing out as the first in the batch. I did further studies and training in the United Kingdom and passed the overseas exams comfortably.

I served as a consultant in many hospitals in Sri Lanka, including Matara, Ratnapura, Peradeniya and from 1997 up to date at the Sri Jayewardenepura General Hospital. I also served as a senior lecturer at University of Peradeniya and as the Professor in the Medical faculty of the Kotalawala Defence University. I will be retiring from the government service in December 2020 after a long service of 41 years.

I always believe we need to do something valuable for our country. I took leadership in providing health services to the affected people during the Tsunami, displaced people during the final stages of the war and marooned flood victims. My fellow Palians joined me in many of these humanitarian efforts just as they do in all activities of our school. This reflects the true Palian spirit, which further strengthens our bonds.

Our daughter is a law graduate working for women's rights and, our son is a doctor in the government sector. My hobbies are travelling, wildlife, music, meeting friends and helping the needy.

Even though there have been thousands of students who studied at our school, only a handful of them come back to school as I do. Even among my classmates, only one or two do that. However, we are the ones who still regularly visit and help the school to get a unique nostalgic satisfaction which makes us feel so content and happy, which no money can ever buy. I think it is akin to the feeling a small child gets when they visit their grand old yet graceful grandmother.

During all these years, my wife and I have kept in touch with Dharmapala Vidyalaya. We have assisted the school in many ways through the Past Pupils Association, particularly my decade group "Araliya". I deliver lectures to the students regularly on the invitation of the principal and the teachers and always try to impress upon the students the values of Dharmapala tradition in addition to learning the subject matter.

## 3) My bits of advice for the next generation can be summed as follows:

Firstly, never follow or go after politicians for personal gains. It would help if you stood by yourself to gain what you deserve. Except for a handful, all the politicians in this country are corrupt and crooked. There is nothing a young person can get from these psychologically bankrupts.

My second advice is to respect everyone. Every profession has a value. From a labourer to the CEO of a company, everyone has an important role to play for the society. Young people must learn to respect everyone irrespective of their social class or amount of money they have, but for the deeds of a person.

My final advice is not to forget your family, your loved ones, people who helped you and the places where you gained knowledge and success. I have never forgotten my school even though I'm about to retire this year. I still respect all the teachers who used to teach me as well as the present-day teachers. I'm still keen on helping my school and will never forget my alma mater, Dharmapala Vidyalaya, Pannipitiya.

# 2020/2021 පරිපාලන වර්ෂයේ
# විදුහල බබළවන පෙරමග ව්‍යාපෘති

2020/2021 පරිපාලන වර්ෂය සඳහා නව විධායක කමිටුව 2020/02/23 වන දින පත් වූ අතර නව විධායක කමිටු ව පත් වී මාසයක් පමණ කාලයක් ගතවීමත් සමගම රටේ ඇති වූ වසංගත තත්ත්වය සමග වුවත් පෙරමග සාමාජිකයන්ගේ නොපසුබට උත්සහයේ සහ එකමුතුකමේ ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගේ ශ්‍රමය මෙන්ම මූල්‍යමය දායකත්වයෙන් ව්‍යාපෘති රාශියක් මෙම වසරේ දී සිදුකරන ලදී. එහි සාරාංශගත පෙළගැස්ම පහත පරිදි වේ.

## විදුහල්පති නිල නිවස අළුත්වැඩියාව

අප විද්‍යාලයීය අභිනව විදුහල්පතිතුමා නැවත පාසල වෙත පැමිණීමේදී විදුහල්පති නිල නිවස ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් සිදු කිරීම සඳහා කටයුතු සම්පාදනය කරන ලද අතර එහිදී පෙරමග දශක කණ්ඩායම රු.130000/- ක මූල්‍යමය දායකත්වයක් ලබාදීම මගින් මෙම වැඩපිලිවෙල සඳහා සිය සහයෝගය ලබා දෙන ලදී.

## දම්පල් සවියට දායකත්වය ලබාදීම.



ධර්මපාල විද්‍යාලයීය ආදී ශිෂ්‍ය මව් සංගමය මගින් ආරම්භ කරන ලද දම්පල් සවිය ව්‍යාපෘතිය මගින් කොවිඩ් 19 වසංගත තත්ත්වය සමඟ රටේ පැනවූ ඇඳිරි නීති සමයෙහි අප පාසලේ ඉගෙනුම ලබන අඩු ආදායම් ලාභී පවුල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන් හඳුනාගෙන ඔවුන් හට වියළි ආහාර ද්‍රව්‍ය අඩංගු ආහාර මල්ලක් ලබාදීමේ වැඩසටහනක් ආරම්භ කරන ලදී. එහිදී රටේ පවතින ඇඳිරි නීති තත්ත්වය සහ කොවිඩ් 19 රෝගය යන දෙයාකාරයේ බලපෑම් පසෙකලා පෙරමග සාමාජිකයන් නොපසුබටව ලබාදුන් ශ්‍රම දායකත්වය මෙන්ම විධායක කමිටුවක් වශයෙන් පෙරමග විධායක කමිටුවේ සියලුම සාමාජිකයන් එකතු වී මූල්‍යමය ආධාරයක් ලබාදීම මගින් ද මෙම ව්‍යාපෘතිය සඳහා දායකත්වය දැක්වීමට අප කණ්ඩායමට හැකි විය.

## ආපන ශාලාවේ පිටුපස තාප්පය පිළිසකර කිරීම හා එම ගොඩනැගිල්ලේ පඩිපෙල දෙපස බිත්ති පින්තාරු කිරීම



අප විද්‍යාලයීය ආපන ශාලාවේ පිටුපස තාප්පය අබලන් තත්වයක පැවතීම හේතුවෙන් එම තාප්පයේ ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් සිදු කිරීමේ අවශ්‍යතාවය පැන නැගුණි. එම අවස්ථාවේ විදුහල්පතිතුමාගේ ඉල්ලීම පරිදි එම තාප්පය සම්පූර්ණයෙන්ම එම ස්ථානයෙන් ඉවත් කරන ලද අතර එහි අත්තිවාරම ද අබලන් තත්වයක පැවතීම හේතුවෙන් ගලවා ඉවත් කොට කොන්ක්‍රීට් බීම් එකක් දමා එම කටයුතු නිම කිරීමට අවශ්‍ය රු. 237280/- ක වටිනාකමකින් යුතු ද්‍රව්‍යමය දායකත්වයක් හා ශ්‍රම දායකත්වයක් ලබාදීමට පෙරමග කණ්ඩායමට හැකි විය. තවද ආපන ශාලාවේ පඩිපෙල දෙපස බිත්ති පින්තාරුකොට එම ස්ථානය පිරිසිදු කිරීමේ කටයුතු සඳහාද අප කණ්ඩායමේ දායකත්වය ලබා දෙන ලදී.



## ඩෙස්ක් පුටු අළුත්වැඩියාව

පසුගිය වසර දෙකේදී මෙන්ම මෙම වසරේද මෙම ව්‍යාපෘතිය අතිසාර්ථක ලෙස පෙරමග කණ්ඩායමට නිමකිරීමට හැකි විය. දැනට භාවිතයට නොගෙන අතහැර දමා තිබූ අබලන් වූ මේස හා පුටු නැවත පාවිච්චියට ගත හැකි ආකාරයට අළුත්වැඩියා කර පාසලට භාරදීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ විය. මෙම වසර තුල පුටු 100 කට අධික ප්‍රමාණයක් හා ඩෙස්ක් 40 කට අධික ප්‍රමාණයක් අලුත් වැඩියා කර පාසල වෙත භාරදීමට පෙරමග දශක කණ්ඩායමට හැකිවිය. මෙම ව්‍යාපෘතියට සමගාමීව ප්‍රධාන ශාලාවේ ප්ලාස්ටික් පුටු අංකනය කිරීමේ කටයුත්ත සඳහා ද අප කණ්ඩායමේ දායකත්වය ලබාදෙන ලදී.



## සීඩා ගොඩනැගිල්ලේ පොත් පිළිවෙලකට සකස් කිරීම

අප විදුහල්පතිතුමාගේ ඉල්ලීම පරිදි අපිළිවෙලට සීඩා ගොඩනැගිල්ලේ කාමරයක් තුල ගොඩගසා තිබූ පාසල් පෙළ පොත් පාවිච්චියට ගත හැකි සහ ගත නොහැකි යන දෙයාකාරයෙන් වර්ගීකරණය කිරීම සහ පාවිච්චියට ගත හැකි පෙළපොත් නැවත අළුත් ස්ථානයකට ගෙනගොස් පිළිවෙලින් වර්ගීකරණය කිරීම හා මෙම කාර්යය සඳහා සීඩා ගොඩනැගිල්ලේ අවශ්‍ය ස්ථාන පිරිසිදු කිරීම මෙම ව්‍යාපෘතියෙහි මූලික අරමුණ විය. අප කණ්ඩායමේ සාමාජික සාමාජිකාවන්ගේ ශ්‍රම දායකත්වයෙන් අතිසාර්ථක ලෙස මෙම ව්‍යාපෘතිය නිම කිරීමට හැකි විය.

## පළමු කොවිඩ් රැල්ලෙන් පසුව පාසල ආරම්භ කිරීමට අවශ්‍ය විෂබීජහරණ උපකරණ ලබාදීම සහ ශ්‍රම දායකත්වය සැපයීම

පළමු කොවිඩ් රැල්ල අවසන්වීමත් සමග පාසල නැවත ආරම්භ කිරීමේදී පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සෞඛ්‍යාරක්ෂාව සඳහා අවශ්‍යය කටයුතු සම්පාදනය කිරීමේ වැඩසටහනක් පාසලේ ක්‍රියාත්මක විය. ඒ සඳහා අවශ්‍ය වන විෂබීජහරණ පාපිසි 7 ක්, උෂ්ණත්වමාන 8 ක්, දැතින් ක්‍රියාත්මක කරන විෂබීජනාශක දියර ඉසින යන්ත්‍ර 2 ක්, ඉන්ධන වලින් ක්‍රියාත්මක කරන විෂබීජ නාශක දියර ඉසින යන්ත්‍රයක් ද ලබා දුන් අතර පෙරමග සාමාජිකාවකගේ අනුග්‍රහයෙන් සායනික මුඛ ආවරණ 500 ක් ද පාසල වෙත ලබා දීම ට හැකි විය. පාසල ආරම්භ කිරීමෙන් පසුව පාසල තුළ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ආරක්ෂාව උදෙසා ගෙන ගිය වැඩපිළිවෙල සඳහා ද පෙරමග සාමාජික සාමාජිකාවන්ගේ ශ්‍රම දායකත්වය ලබා දෙන ලදී.



## මාස්ක් ව්‍යාපෘතිය

කොවිඩ් 19 රෝගයේ මූලාරම්භයත් සමගම මුඛ ආවරණ පැළඳීමේ අවශ්‍යතාවයට සාමාජයේ සියලු දෙනා පාහේ දැඩිව අවධානය යොමු කරන ලදී. පෙරමග සාමාජිකාවකගේ යෝජනාවකට අනුව කුඩා මූල්‍ය උත්පාදන ව්‍යාපෘතියක් ලෙස මෙම මුඛ ආවරණ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට යෝජනා විය. මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වූයේ කාලයට ඔබින ආකාරයෙන් නිවැරදි සෞඛ්‍ය පුරුදු සඳහා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන් යොමු කිරීමයි. මෙම මුඛ ආවරණ නිෂ්පාදනයේදී නිවැරදි තත්ත්ව සහතිකයකට අයත් අමුද්‍රව්‍ය (තීන්ත සහ රෙදි) යොදාගැනීම හා නිවැරදි ප්‍රමිතියකට අනුව මුඛ ආවරණ නිශ්පාදනය යන ක්‍රියාවලීන් සඳහා ද පෙරමග කණ්ඩායමේ අවධානය යොමු විය. මුඛ ආවරණ නිෂ්පාදනයේ දී අප කණ්ඩායම් සාමාජික දූලාන් දර්ශන මහතාගේ මහගු සහයෝගය අපට විශාල පිටුවහලක් විය. මෙම ව්‍යාපෘතිය මගින් කාණ්ඩ 3 කට අයත් මුඛ ආවරණ හඳුන්වා දෙන ලද අතර ඒවා පාසල් සමූපාකාර හා ලිපි ද්‍රව්‍ය ඒකකයෙන් සහ ආදි ශිෂ්‍ය කාර්යාලයෙන් ඕනෑම අවස්ථාවක මිලදී ගත හැක.

## පෙරමග පොකුර යාවත්කාලීන කිරීම

පෙරමග දශක කණ්ඩායම සාමාජිකයන් 1000 කටත් අධික පිරිසකගෙන් සමන්විත ක්‍රියාකාරී දශක කණ්ඩායමකි. එහිදී සාමාජිකයන්ගේ තොරතුරු වර්ගීකරණය කර ගැනීමේ පහසුව සඳහා පෙරමග පොකුර යාවත්කාලීන කිරීම අත්‍යවශ්‍ය කාරණයක් වේ. පෙරමගින් සංවිධානය කරනු ලබන ව්‍යාපෘතීන් සඳහා එම ව්‍යාපෘති වල ස්වරූපය අනුව ඒ සඳහා සහයෝගය ලබාගත හැකි සාමාජිකයින් ක්ෂණිකව සම්බන්ධ කරගැනීමේ පහසුව පිණිස පසුගිය වසරේ මෙන්ම මෙම වසරේද පෙරමග පොකුර යාවත්කාලීන කිරීමේ කටයුතු සාර්ථකව සිදු කිරීමට හැකි විය.

## පෙරමගින් පෙරමගට සාමාජික සුභසාධන වැඩසටහන

පෙරමග සාමාජික සාමාජිකාවන්ගේ සුභසාධනය උදෙසා විධිමත් වැඩපිළිවෙලක අවශ්‍යතාවය පැනනැගුණු බැවින් ''පෙරමගින් පෙරමගට සාමාජික සුභ සාධන වැඩසටහන'' ආරම්භ කරන ලදී. ඒ අනුව 2020/2021 විධායක කමිටුව රැස්වී සාමාජිකයකුගේ වියෝවින් පසු ඔහුගේ හෝ ඇයගේ පවුලේ සාමාජිකයන්ට යම්කිසි මූල්‍යමය ආධාරයක් ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලද අතර මෙම වැඩපිළිවෙල ඉදිරියට පවත්වාගෙන යාමේ ක්‍රමවේදය තත්කාලීන විධායක සභාව මගින් නැවත සාකච්ඡා කොට කාලයට ඔබින ආකාරයෙන් , අවශ්‍යතාවය හා මූල්‍ය තත්ත්වයන්ද සැලකිල්ලට ගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී. තවද එම වැඩසටහන යටතේ මෙවර විධායක සභාවේ ඒකමතික තීරණය මත අප අතරින් වෙන්වූ සාමාජිකයකුගේ හා සාමාජිකාවකගේ පවුලේ සාමාජිකයන් වෙත මූල්‍යමය පරිත්‍යාගයක් ලබාදෙන ලදී.



## පෙරමග සය සාමාජික ක්‍රිකට් තරඟාවලිය

පෙරමග සාමාජිකයන්ගේ සහෝදරත්වය හා සුහදත්වය වර්ධනය කරගැනීම උදෙසා වසර 13 ක් පුරාවට නොකඩවා මෙම වැඩසටහන අතිසාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමට පෙරමග කණ්ඩායමට හැකි විය. මෙවර අප පාසල් ක්‍රීඩාංගණයේදී 2020/10/04 වන දින 26 කට අධික කණ්ඩායම් ප්‍රමාණයකගේ හා විශාල සාමාජික පිරිසකගේ සහභාගීත්වයෙන් මෙම තරගාවලිය පැවැත්වීමට හැකි වූ අතර මෙහි ශූරතාවය ''නිම්තරු කන්ස්ට්‍රක්ෂන්'' කණ්ඩායමට හා අනුශූරතාවය ඇරැව්වල සමගි ක්‍රීඩා සමාජ කණ්ඩායමට හිමි විය.

## ක්‍රීඩාංගණයේ ඇතුළු කාමරයේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම

අප සංගමය මගින් සංවිධානය කරනු ලැබූ සය සාමාජික ක්‍රිකට් තරඟාවලියට සමගාමීව ක්‍රීඩාංගණයේ ඇතුළු කාමරයෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සහ ක්‍රීඩා මණ්ඩපයෙහි වහලෙහි ප්‍රතිසංස්කරණ කටයුතු කීපයක් ද පෙරමග කණ්ඩායම විසින් සිදු කරන ලදි.

## අවශ්‍යතාවය සහිත දරුවන්ට ශිෂ්‍යාධාර ලබාදීම

විදුහල්පතිතුමා විසින් නිර්දේශ කරන ලද අඩු ආදායම් ලාභී පවුල් වල සිසු දරු දැරියන් 15 දෙනෙකු උදෙසා රු. 30000/- ක මුදලක් ලබා දීමට මෙම වර්ෂයේදී ද පෙරමග දශක කණ්ඩායමට හැකි විය. මෙම ශිෂ්‍යාධාර ලබාදීම සඳහා පෙරමග කණ්ඩායමේ NDB ශාඛාවේ පවතින ස්ථාවර තැන්පතුවෙහි පොළී මුදල යොදාගනු ලැබේ.

## ලෝක ළමා දිනය වෙනුවෙන් පෙරමග දායකත්වය

ඔක්තෝම්බර් 1 වන දිනට යෙදී තිබූ ලෝක ළමා දිනය වෙනුවෙන් මෙවර අප පාසලේ සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට දිවා ආහාර වේලක් ලබාදීම සඳහා විදුහල්පතිතුමා විසින් වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. රු. 202500/- ක මුදලකින් පෙරමග කණ්ඩායම මෙම ව්‍යාපෘතියට දායක වූ අතරම බොහෝ සාමාජිකයන්ගේ ශ්‍රම දායකත්වය ද මෙම වැඩසටහන සඳහා ලබාදෙන ලදී. එමෙන්ම මෙම ව්‍යාපෘතිය සැලසුම් කල දිනයේ සිට ව්‍යාපෘතිය අවසානය තෙක්ම නොමසුරු දායකත්වයක් ලබාදීමට පෙරමග කණ්ඩායමට හැකිවිය.

12 වෙනි පිට බලන්න .......

## පුස්තකාලයේ තීන්ත ආලේප කිරීම හා පොත් ලැයිස්තුගත කිරීම

අප විද්‍යාලයීය විදුහල්පතිතුමාගේ ඉල්ලීම පරිදි පුස්තකාල ගොඩනැගිල්ල ඇතුලත නියමිත ප්‍රමිතියකට අනුව ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර අනාගත සිසු පරපුරට මෙහි අගුළු ඵල නෙලාගැනීමේ අවස්ථාව සැලසීම මෙහි මූලික අරමුණ විය. මෙම ව්‍යාපෘතියේ දී ද පෙරමග සාමාජික සාමාජිකාවන්ගේ ශ්‍රම හා මූල්‍යමය දායකත්වය නොඅඩුව අප සංගමයට ලැබුණි. එමෙන්ම පුස්තකාලයේ ඇති පොත් ලැයිස්තුගත කිරීමේ කටයුතු සඳහා ද අපගේ දායකත්වය ලබාදීමට අපට හැකි විය.

## මව් සංගමයේ ව්‍යාපෘතියක් වන ව්‍යායාම මධ්‍යස්ථානයට මුල්ගල තැබීමට පෙර එම ස්ථානය අවට පිරිසිදු කිරීම, තීන්ත ආලේප කිරීම හා ප්‍රචාරණ පුවරු සවි කිරීම.

මව් සංගමය මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියක් වන ව්‍යායාම මධ්‍යස්ථානය සඳහා ගරු ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ මැතිතුමාගේ මූලිකත්වයෙන් මුල්ගල තැබීමේ කටයුතු සූදානම් කර තිබූ අතර එම කටයුතු සඳහා පෙර සූදානම වශයෙන් මුල්ගල තැබූ ස්ථානය අවට පිරිසිදු කර තීන්ත ආලේප කිරීම හා ප්‍රචාරක පුවරුව සවිකිරීමේ කටයුතු පෙරමග කණ්ඩායමේ ශ්‍රම දායකත්වයෙන් සිදු කරන ලදී.



## පාසල තුල පළතුරු පැල සිටුවීමේ ව්‍යාපෘතිය

අප කණ්ඩායමේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක කරනු ලැබූ හරිත ව්‍යාපෘතිය යටතේ විදුහල්පතිතුමා විසින් නිර්දේශිත ස්ථාන වල පළතුරු පැල සිටුවීමේ වැඩසටහනක් පාසල තුල සිදුකරන ලදී. එහි පළමු අදියර ලෙස පළතුරු පැල 25 ක් ක්‍රීඩාංගණය වටා රෝපණය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලද අතර මෙම ව්‍යාපෘතියේ මූලික පරමාර්ථය වනුයේ අනාගත දම්පල් දරු දැරියන් වෙනුවෙන් ස්වභාවික සුන්දරත්වයෙන් පිරිපුන් වටපිටාවක් පාසල තුල නිර්මාණය කර දීමයි.

## සුගතපාල මහතාගේ නිළ නිවස ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම

දීර්ඝ කාලයක් තිස්සේ අප විද්‍යාලය වෙනුවෙන් සේවය කර දැනට විශ්‍රාම ලබා සිටින සුගතපාල මහතාගේ නිළ නිවස වසර 15 කට පසු ඔහුට කෘතගුණ දැක්වීමක් වශයෙන් ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර ඒ මහතා වෙත භාරදෙන ලදී. මෙහිදී නිළ නිවසෙහි ගෙබිමෙහි තීන්ත ආලේප කිරීම ද බිත්ති සහ දොර ජනෙල් පින්තාරු කිරීම ද ප්‍රධාන වශයෙන් සිදුකරන ලද කාර්යයන් වේ. එමෙන්ම මෙම ව්‍යාපෘතිය සැම දෙනාගේම විශේෂ පැසසුමට ලක්වූ ව්‍යාපෘතියක් බවට පත්විය.



## ශ්‍රවණාගාරයේ සහ ළමා පුස්තකාලයේ අබලන් වූ කුෂන් පුටු නැවත පිළිසකර කිරීම හා මේස නැවත අළුත්වැඩියා කිරීම



විද්‍යාලයීය ශ්‍රවණාගාරයෙහි සහ ළමා පුස්තකාලයේ දිගු කාලයක් තිස්සේ පරිහරණය කර තිබූ කුෂන් පුටු අබලන් තත්ත්වයේ පැවතීම හේතුවෙන් එම පුටු නැවත අලුතින් කුෂන් යොදා පරිහරණයට ගත හැකි ආකාරයෙන් පාසල වෙත ලබා දීමේ කටයුත්ත මෙම ව්‍යාපෘතිය මගින් සිදුකරන ලදී. මෙහිදී කුෂන් කොටස් 174 ක ප්‍රමාණයක් නැවත අළුත්වැඩියා කර එම ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකරන ලද අතර මෙම ස්ථානවල තිබූ මේස 8 ක් ද සම්පූර්ණයෙන් අළුත්වැඩියා කිරීම සඳහා පෙරමග කණ්ඩායමේ ශ්‍රම හා මූල්‍යමය දායකත්වය ලබාදෙන ලදී.

## වැසිකිළි ව්‍යාපෘතිය, හරිත ව්‍යාපෘතිය සහ කෞතුකාගාරයේ පසු විපරම

පෙරමග දශක කණ්ඩායම විසින් අප පාසලේ 6-9 ශ්‍රේණිවල දරුවන් සඳහා තිළිණ කරන ලද වැසිකිළි සංකීර්ණයෙහි ගලි වලට ජලය පිරීම හේතුවෙන් එම ගලි නැවත සම්පූර්ණයෙන් පිරිසිදු කොට 3/4 ප්‍රමාණයෙන් කළු ගල් බැමි යොදා ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන ලදී.
එමෙන්ම හරිත ව්‍යාපෘතිය යටතේ පරිගණක විද්‍යාගාරය පිටුපස දැල්වැටෙහි හා විද්‍යාලයීය ප්‍රධාන පිවිසුමේ සිට ප්‍රධාන ශාලාව දක්වා ඇති දැල් වැටෙහි තිබූ මල් බඳුන් වලට අළුතින් මල් පැල යොදා නැවතත් විදුහල් භූමියට අලංකරණයක් එක් කිරීමට කටයුතු කරන ලදී.
පෙරමග කණ්ඩායමේ දායකත්වයෙන් ඉදිකරන ලද විද්‍යාලයීය කෞතුකාගාරය පිළිබඳව පසුවිපරමක් වශයෙන් එහි අපවිත්‍රව තිබූ තැන් නැවතත් පිරිසිදු කර යථා තත්ත්වයට පත් කිරීම ද සිදු කරන ලදී.

## පාසලේ විශබීජහරණ ක්‍රියාවලිය

පෙරමග කණ්ඩායම විසින් පාසල විවෘත කිරීමේ දී පාසලේ විෂබීජහරණ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය වන 500ml ප්‍රමාණයේ විශබීජ නාශක දියර බෝතල් 150 ක් හා 200 ml ප්‍රමාණයේ බෝතල් 120 ක ද්‍රව්‍යමය දායකත්වයක් ලබා දෙන ලදී.

## පෙරමග සඟරාව

පෙරමග දශක කණ්ඩායම මගින් පුවත් සඟරාවක් නිර්මාණය කර සාමාජිකයන් අතට පත් කිරීමේ කටයුත්ත ගිය වසරේ මෙන්ම මෙම වසරේදී ද සාර්ථකව සිදු කිරීමට අප කණ්ඩායමට හැකි විය. සඟරාව මුද්‍රණය කිරීමේ මූලික අරමුණ ලෙස පෙරමග කණ්ඩායම මගින් වාර්ෂිකව සිදුකරන ව්‍යාපෘති පිළිබඳව සාමාජිකයන් දැනුවත් කිරීම, සාමාජික ප්‍රවර්ධනය හා සාමාජිකයන්ගේ නිර්මාණ හා අදහස් වලට ඉඩහසර ලබාදීම යනාදිය දැක්විය හැක. මෙවර පෙරමග සඟරාව 15 වන පෙරමග මහා සභා රැස්වීමේදී සියලු සාමාජිකයන් අතට පත් කිරීම සඳහා කටයුතු සූදානම් කර ඇත.

තිළිණි ශ්‍යාලිකා තිලකරත්න

# තරුවක් සමග වරුවක්

## පාසැල් තුලදී විෂය බාහිර ක්‍රියාකාරකම් වලට දායක වීම ඉතාම ප්‍රයෝජනවත් වෙනවා





මා නොවන මම, ඩෙල් ස්ටුඩියෝ, ලෙය සහ ලය, මා නොවන ඔබ ඇතුලු ශ්‍රී ලංකාවේ සංගීත ක්ෂේත්‍රයේ පෙරළිකාර සංගීත වැඩසටහන් නිෂ්පාදකවරයකු වෙනුවෙන් තරුවක් සමග වරුවක් විශේෂාංගය වෙන් කෙරෙනවා. ඔහු සංගීත ක්ෂේත්‍රයේ ඉතාම සුවිශේෂී චරිතයක් වගේම අප පාසැලට විශාල කීර්තියක් ගෙන දුන් දම්පල් විද්‍යපියසේ අකුරු කළ, වර්තමානයේ පෙරමග ක්‍රියාකාරී සාමාජිකයෙක් වන චින්තක දිලංග ගම්ලත් මහතා.

දෙරණ මාධ්‍ය ආයතනයේ ජ්‍යෙෂ්ඨ නිෂ්පාදක අධීක්ෂකවරයෙකු ලෙස සේවය කරන ඔහුගේ ජීවිත අත්දැකීම්, මුහුණ දුන් අභියෝග සහ අනාගත බලාපොරොත්තු අප බෙදා ගත්තේ මේ අයුරින්.

### '' ඔබ සංගීත ක්ෂේත්‍රයට පිවිසි ආකාරය ගැන සඳහන් කළොත් ''

කුඩා කල සිටම සංගීත කණ්ඩායම් සාමාජිකයෙකු ලෙස විවිධ රූපවාහිනී වැඩසටහන් වලට දායකත්වය ලබා දීමට අවස්ථාව ලැබුණා. එම අවස්ථා වලදී මේ ක්ෂේත්‍රය පිළිබඳ ආසාවක් ඇති වුණා. උසස් පෙළ අවසන් කර රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදනය පිළිබඳ ඩිප්ලෝමාවක් හැදෑරීමෙන් පසු ක්ෂේත්‍රයට අවතීර්ණ වුණා.

### '' පාසල් යන අවධියේ තිබූ දක්ෂතා මොනවාද? ''

''පාසල් විෂය ධාරාවට අමතරව මළල ක්‍රීඩාවට දක්ෂතා දැක්වූවා. පාසැල් සමයේ ශිෂ්‍ය නායක හා උප ප්‍රධාන ශිෂ්‍ය නායක තනතුරු හෙබවූවා. මීට අමතරව රිය නියාමක සංගමය, ජනමාධ්‍ය සංගමය හා බෞද්ධ සංගමය වෙනුවෙන් දායකත්වය ලබා දෙනු ලැබුවා.''

### '' පාසැල් සමයේ ඔබට මතක හිටින චරිත ගැන සඳහන් කලොත් ''

''ධර්මපාල විද්‍යාලයේ වර්තමාන විදුහල්පති කේ.ජී. විමලසේන මැතිතුමා, හිටපු විදුහල්පති ආර්.ජ්. රාජපක්ෂ මැතිතුමා මට පාසැල් කාලයේ ලොකු දිරියක් ලබා දුන්නා. ඒ වගේම සංගීත ගුරුභවතුන් ලෙස සේවය කල ආනන්ද වැදණ්ඩ, පූර්ණිමා වික්‍රමසිංහ සහ චමරි අලුත්ගෙදර යන මහත්ම මහත්මීන් මාගේ සංගීත කටයුතු සඳහා ඉමහත් පිටුවහලක් වූවා.''



### '' දැනට ලබා ඇති සම්මාන ''

'' 2015 සිට 2019 වසරවල් වල හොඳම සංගීත වැඩසටහන ලෙස රාජ්‍ය සහ රයිගම් සම්මාන උළෙල දෙකේදීම සම්මානයට පාත්‍ර වීම මාගේ දිවියේ ලබා ඇති සුවිශේෂී ජයග්‍රහණයක්. මීට අමතරව සුමති සම්මාන සඳහා නිර්දේශ වීමට අවස්ථාව උදාකරගැනීම ගැන ඉතා සතුටට පත් වෙනවා. ''

### '' ඔබගේ අනාගත බලාපොරොත්තු මොනවාද?''

'' මම 2008 දී සහය නිෂ්පාදකවරයෙක් ලෙස සංගීත ක්ෂේත්‍රයට පිවිස අද වන විට සිනමා සහ රූපවාහිනී වැඩසටහන් පිළිබඳව තාක්ෂණවේදී උපාධිය දක්වා හැදෑරීම කර තිබෙනවා. අනාගතයේදී රූපවාහිනී සංගීත වැඩසටහන් අධ්‍යක්ෂනය ගැන තව දුරටත් හැදෑරීම සහ මගේම සිනමා නිර්මාණයක් කිරීමට බලාපොරොත්තු වෙනවා.''



### '' ක්ෂේත්‍රයට සම්බන්ධ වීමට කැමති පාසල් දරුවන්ට ලබාදෙන උපදෙස් මොනවාද? ''

'' පළමුවෙන් තමන් මේ ක්ෂේත්‍රයේ හෝ මොන යම් කටයුත්තකට ස්ව කැමැත්ත ඇති කරගත යුතුයි. ඊට පසුව ඒ ක්ෂේත්‍රය ගැන මූලික දැනුම සහ සුදුසුකම් ලබාගන්න උත්සහ කිරීම වැදගත්. පාසැල තුලදී විෂය බාහිර ක්‍රියාකාරකම් වලට දායක වීම ඉතාම ප්‍රයෝජනවත් වෙනවා. ''

'' මීට අමතරව වර්තමාන දෙමාපියන් වෙනුවෙන් මම පණිවිඩයක් දිය යුතුයි. ඔබේ දරුවා කුඩා කල සිට දක්වන දක්ෂතා දෙස අවධානයෙන් සිටින්න. එයින් ඔහු හෝ ඇය වැඩි දක්ෂතා පෙන්වන ක්ෂේත්‍රය කෙරෙහි යොමුකිරීම ඉතාම වැදගත්. එයින් ලබාගන්නා පන්නරය ඒ ක්ෂේත්‍රය තුළ ඉදිරියට යාමට ලොකු දායකත්වයක් සපයනවා.''



කල්පිත කෝදාමුල්ල

# සෞන්දර්යය අංශයෙන් දම්පල් කිරුළ බබළවන සොඳුරු මිණිකැට ....

මෙම විශේෂාංගයෙන් දක්වෙන්නේ දම්පල් සෞන්දර්ය විෂයන් වලින් පාසල් මැණියන්ගේ කිරුළ බබළවන දූ පුතුන් පිරිසකගේ දක්ෂතාවන් පිළිබඳවයි.



### චමල් නිමාෂ් නයනජිත්
### උසස් පෙළ

2010 සිට මේ වනතෙක් පැවැත්වූ සියලු සංකලන ප්‍රසංග හා උත්සව වල වාදනය මෙන්ම ගායන අංශයෙන් දස්කම් පෑම.
පාසල් වාද්‍ය වෘන්දයේ ලීඩ් ගිටාර්, බැන්ජෝ, මැන්ඩලීන් වාදකයා ලෙස කටයුතු කිරීම මෙන්ම සංගීත මෙහෙයවන්නා ලෙස පත් වීම.
සමස්ත ලංකා තරඟාවලියේ සංගීත අංශයේ ස්වතන්ත්‍ර ගීත නිර්මාණ අංශයෙන් ප්‍රථම ස්ථානය ලබා ගැනීම.
පාසලේ පැවැත්වෙන උත්සව සඳහා ගීත නිර්මාණයෙන් දායක වීම.



### නිශාදි සඳමිණි විජේසේකර සුබසිංහ
### උසස් පෙළ

පාසලේ පැවැත්වුණු සියලු උත්සව, විශේෂාංග වලදී සංගීත අංශයෙන් සහභාගී වීම.

සමස්ථ ලංකා තරඟාවලියේ ශාස්ත්‍රීය අංශයෙන් දෙවන ස්ථානය හා සංගීත ස්වතන්ත්‍ර ගීත නිර්මාණ අංශයෙන් ප්‍රථම ස්ථානය ලබා ගැනීම.

පාසල් වාද්‍ය වෘන්දයේ වයලින් වාදනය කිරීම මෙන්ම පාසලේ රසවින්දන වැඩසටහන් වල ඒකල ගායනා ඉදිරිපත් කිරීම හා ගීත නිර්මාණය කිරීම.



### එන්.ඩී.එස්.එන්.පී. මධුසංඛ ප්‍රේමලාල්
### උසස් පෙළ

සමස්ත ලංකා නර්තන තරඟාවලියේ "පහතරට කවිතාල (බෙර) අංශයේ ප්‍රථම ස්ථානය දිනා ගැනීම.

බස්නාහිර පළාත් නර්තන තරඟාවලියේ දෙවන ස්ථානය දිනා ගැනීම.

**NSBM** සාහිත්‍ය කලා මංගල්‍යයේ නර්තන තරඟාවලියේ (කණ්ඩායම්) දෙවන ස්ථානය දිනා ගැනීම.

ජාත්‍යන්තර ශිෂ්‍යභට උත්සව දිනය හා පාසලේ පැවැත්වූ සියලු උත්සව අවස්ථා සඳහා නර්තනයෙන් දායකත්වය ලබා දීම.



### එල්.ඒ.ඩී.තරුෂි කවීශා ජයසේකර
### උසස් පෙළ

බස්නාහිර පළාත් නර්තන තරඟාවලියේ දෙවන ස්ථානය දිනා ගැනීම.

**NSBM** සාහිත්‍ය කලා මංගල්‍යයේ නර්තන තරඟාවලියේ (කණ්ඩායම්) දෙවන ස්ථානය දිනා ගැනීම.

ජාත්‍යන්තර ශිෂ්‍යභට උත්සව දිනය හා පාසලේ පැවැත්වූ සියලු උත්සව අවස්ථා සඳහා නර්තනයෙන් දායකත්වය ලබා දීම.



### එච්.දුල්මිණි රසදරා ද සොයිසා
### උසස් පෙළ

**EDEX** සිතුවම් 2018 චිත්‍ර තරඟයෙන් ජ්‍යෙෂ්ඨ අංශයේ කුසලතා සම්මානය දිනා ගැනීම.

2018 වසරේදී අධ්‍යාපන අමාත්‍යංශය හා පැෆරල් සංවිධානය ඒකාබද්ධව පවත්වනු ලැබූ "ප්‍රජාව අපි ප්‍රජාතන්ත්‍රවාදය අපිමයි" සමස්ත ලංකා චිත්‍ර තරඟයෙන් කලාප මට්ටමේ ජයග්‍රහණය කිරීම.

ප්‍රකාශන චිත්‍ර අංශයේ 2 වන ස්ථානය -2018 "සමර්පණ" වාර්ෂික කලා උළෙල

විශිෂ්ඨ කුසලතා සම්මානය - පුස්තකාල දිනය -2017 (ධර්මපාල විද්‍යාලය පන්නිපිටිය)

දම්පල් සිත්තම් - චිත්‍ර තරඟය 2010 වසරේ 4 ශ්‍රේණියේ ප්‍රථම ස්ථානය දිනා ගැනීම. පිළිවෙලින් 2012, 2014 කුසලතා සම්මානය, 2016 විශිෂ්ඨ කුසලතා සම්මානය දිනා ගැනීම.



### අයි.කේ.කේ.කසුනි ගමින්දි සන්තුෂා
### උසස් පෙළ

**EDEX** සිතුවම් 2018 චිත්‍ර තරඟයෙන් ජ්‍යෙෂ්ඨ අංශයේ කුසලතා සම්මානය දිනා ගැනීම.

2018 වසරේදී අධ්‍යාපන අමාත්‍යංශය හා පැෆරල් සංවිධානය ඒකාබද්ධව පවත්වනු ලැබූ "ප්‍රජාව අපි ප්‍රජාතන්ත්‍රවාදය අපිමයි"සමස්ත ලංකා චිත්‍ර තරඟයෙන් කලාප මට්ටමේ ජයග්‍රහණය කිරීම

මෝස්තර අංශයේ චිත්‍ර තරඟයේ 2 ස්ථානය "සමර්පණ" - වාර්ෂික කලා උළෙල 2018

පුස්තකාල දිනය -2018 ප්‍රධාන පුස්තකාලය මගින් සංවිධානය ලද චිත්‍ර තරඟාවලියේ ප්‍රථම ස්ථානය දිනා ගැනීම.

# සෞන්දර්යය අංශයෙන් දම්පල් කිරුළ බබළවන සොඳුරු මිණිකැට ....



**ජී.ඩී.ජනිත් බිම්සර**
**11 ශ්‍රේණිය B**

අප පාසලේ නාට්‍ය සංගමයේ ප්‍රධාන සංවිධායක ධූරය දැරීම.

ජපානයේ ග්‍රීන් ක්‍රොස් නාට්‍ය තරඟාවලියේ දෙවන ස්ථානය ලබාගැනීම.

ටවර් හෝල් පදනම මගින් පැවැත්වූ නාට්‍ය තරඟාවලිය සඳහා පාසල් නාට්‍ය අංශයෙන් සහභාගී වීම.

විදේශීය අධ්‍යාපන නිරීක්ෂණ කණ්ඩායමක් අප පාසලට පැමිණි අවස්ථාවේ අභිරූපණ රංගනයක් ඉදිරිපත් කිරීම.

අන්තර් පාඨශාලීය නාට්‍ය රැසකට මෙන්ම පරිසර දිනය, ලෝක ළමා දිනය, ගුරු දිනය, කලා උළෙල, සංකලන ආදී දින හා ප්‍රසංග රැසකට නාට්‍යමය දායකත්වය ලබා දීම.

රාජ්‍ය ආයතන මගින් සංවිධානය කරන ලද ''සුරක්ෂා'', ''පරිස්සමින් ගිහින් එන්න'', ආදී වූ වැඩසටහන් තුළින් නාට්‍ය ඉදිරිපත් කර පාසල් සිසුන් දැනුවත් කිරීම.

සෞන්දර්ය අංශය මගින් පවත්වන ලද සමාජ සත්කාරයක් වන අපේක්ෂා රෝහලට ගොස් එහි රෝගීන්ගේ මානසික සුවය පතා නාට්‍ය රඟ දැක්වීම.



**හිරුෂ විජයරත්න**
**9 ශ්‍රේණිය G**

2019 වර්ෂයේ සමස්ත ලංකා බටහිර සංගීත තරඟාවලියේ තනි පුද්ගල පියානෝ වාදන අංශයේ ප්‍රථම ස්ථානය හිමිකර ගැනීම.

2018 වර්ෂයේ ඉංග්‍රීසි ගායනා තරඟාවලියේ පියානෝ වාදනය කිරීම.



**තිළිණි භාග්‍යා ප්‍රේමලාල්**
**11 ශ්‍රේණිය B**

අප පාසලේ නාට්‍ය සංගමයේ ලේකම් ධූරය දැරීම.

ජපානයේ ග්‍රීන් ක්‍රොස් නාට්‍ය තරඟාවලියේ දෙවන ස්ථානය ලබාගැනීම.

ටවර් හෝල් පදනම මගින් පැවැත්වූ නාට්‍ය තරඟාවලිය සඳහා පාසල් නාට්‍ය අංශයෙන් සහභාගී වීම.

විදේශීය අධ්‍යාපන නිරීක්ෂණ කණ්ඩායමක් අප පාසලට පැමිණි අවස්ථාවේ අභිරූපණ රංගනයක් ඉදිරිපත් කිරීම.

අන්තර් පාඨශාලීය නාට්‍ය රැසකට මෙන්ම පරිසර දිනය, ලෝක ළමා දිනය, ගුරු දිනය, කලා උළෙල, සංකලන ආදී දින හා ප්‍රසංග රැසකට නාට්‍යමය දායකත්වය ලබා දීම.

රාජ්‍ය ආයතන මගින් සංවිධානය කරන ලද ''සුරක්ෂා'' , ''පරිස්සමින් ගිහින් එන්න'', ආදී වූ වැඩසටහන් තුළින් නාට්‍ය ඉදිරිපත් කර පාසල් සිසුන් දැනුවත් කිරීම.

සෞන්දර්ය අංශය මගින් පවත්වන ලද සමාජ සත්කාරයක් වන අපේක්ෂා රෝහලට ගොස් එහි රෝගීන්ගේ මානසික සුවය පතා නාට්‍ය රඟ දැක්වීම.

## සෞන්දර්ය විෂය භාර ආචාර්යවරුන්

නලින්ද අංගේකුඹුර මයා

ඩබ්.එම්.ජීවන්ති මිය

ශෂිනි කොල්ලුරගේ මිය

නොයෙල් විතානගේ මයා

අයි.එන්.පී.ගුණවර්ධන මිය

ඊ.ඩී.ආර්. නිලන්ති මිය

ඩී.එස්. දිනුෂා මිය

ජීවන්ති මලිගස්පේ මිය

යූ.එච්.ටී.නිලූකා මිය.

අයේෂා චාමිනී මිය

සුමිත්‍රා කුමාරි මිය

ශ්‍රීමාලි පුෂ්පකුමාරි මිය

ප්‍රියන්ත ගුණසේකර මයා

අරුණි මහේෂිකා



# අපේ කාලේ දම්පල් අඹරේ පැයූ ගුරු තරුව

## ධර්මපාලය කියන්නේ පින් බිමක්!

සරෝජා විමලසිරි කියන චරිතය පෙරමග අපිට ආගන්තුක චරිතයක් නෙමෙයි. පෙරමගට හිතැති, පන්නිපිටිය ධර්මපාලයට දැඩි ලෙන්ගතු බවක් දක්වන ඇය, විටෙක අපට සෙනෙහෙවන්ත ගුරු මවක්. තවත් විටෙක ආදරණීය මවක්. 2001 වසරේ ඉඳන් 2018 විශ්‍රාම යනතෙක්ම මේ චරිත දෙක අතරේ සමබරව දෝලනය වෙමින්, රටට වැඩදායි දම්පල් සිසු පරපුරක් බිහිකරන්නට ඇය කළ කැපවීම කියා නිමකරන්නට බැහැ.
මේ සොඳුරු කතාබහ ඇයත් සමඟයි.

**" ඔබ මේ රම්‍ය විදුහලේම දීප්තිමත් ආදි ශිෂ්‍යාවක්. අපි පටන්ගමු ඒ සුන්දර අතීතයෙන්ම."**

"1973 තමයි මම පාසල් ශිෂ්‍යාවක් වශයෙන් ධර්මපාලයට පිය නගන්නේ. මට මතකයි මම ඉස්කෝලේ එන කාලේ දැන් සෞඛ්‍යදානය තියෙන හරියෙන් ලොකු කන්දක් තිබුණා. වැස්ස දවස්වලට ළමයි ඔය කන්ද දිගේ දුවලා ගිහින් පල්ලෙහාට ලිස්සලා යනවා. ඒ එක්කම මට මතකයි හය වසර වෙනකන්ම අපිට පාසැල ආරම්භ කළේ හවස් වරුවේ."

"මට මතකයි පිට්ටනිය අයිනේ සර්දා කියලා ගුරු මහත්මියක් හිටියා. එයා තමයි දැල්පන්දු පුහුණු කළේ ළමයින්ට. මම හරි ආසාවෙන් ඒ දිහා බලාගෙන හිටියා. ඉස්කෝලේ විවේක කාලය වෙලාවට අපි හැමෝම දුවන්නේ ගේට්ටුව ගාව හිටපු වෙරළු ආච්චි ලඟට. එයාගෙන් වෙරළු, දිවුල් එහෙම අරගන්නවා. දිවුල් ගෙඩි බිඳලා කුරුඳු කෝටු දාලා රස කර කර කනවා අපි හැමෝම. දැන් බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය තියෙන තැන ඉස්සර තිබුණා ළිඳක්. ඉස්කෝලේ හොස්ටල් එකේ නතරවෙලා හිටපු, ඒ වගේම හවස ක්‍රීඩා වලට නැවතුණු ළමයි ඔක්කොම ඔය ළිඳට පැනලා සෙල්ලම් කරනවා. හරිම සුන්දර මතක රාශියක්. ඉස්සර පිට්ටනියේ තිබ්බේ මීටර 200යි. හැම තැනම පාට පාට මල්ගස්. එක පැත්තකින් රෝස මල් තලාවක්. තව පැත්තකින් අරලිය මල් වැටිලා. මුළු ධර්මපාල බිමේම මල් එලලා වගේ. මේ බිම පින් බිමක්. අදටත් ඒක එහෙමමයි කියලා මට හිතෙනවා.''



**" ක්‍රීඩාවට යොමුවුණේ කොයි කාලේද? "**

''වයස 11න් පහළ ඉඳන්ම මම ක්‍රීඩාවට යොමුවුණා. ජවන සහ පිටිය ඉසව් කිහිපයකටම සම්බන්ධ වෙලා මාණ්ඩලික, කලාප සහ සමස්ත ලංකා තරඟ රාශියකින් ඉස්කෝලෙට කීර්තියක් අරන් දෙන්න පුළුවන් වුණා. ඒ වගේම මම මේස පන්දු සහ දැල්පන්දු ක්‍රීඩාවෙන් ජයග්‍රහණ රාශියක් අරගෙන තියෙනවා. එක් අවස්ථාවකදී මාව දැල්පන්දු ජාතික පාසල් කණ්ඩායමටත් තේරුණා. අද ඒ ගැන මතක් කරනකොට දැනෙන්නේ පුදුම සන්තෝසයක් වගේම ආඩම්බරයක්."

**" පාසල් ජීවිතයෙන් පසු ගුරු වෘත්තියට සම්බන්ධ වෙන්නේ කොහොමද? "**

'' 1985 උසස් පෙළ පන්තියේ ඉන්නකොට මම ක්‍රීඩා ගුරු පත්වීමකට අදාළ සම්මුඛ සාකච්ඡාවකට ගියා. මාව ඒකෙන් තේරුණා. මොකද මට ඒ වෙනකොට සමස්ත ලංකා සහ ජාතික මට්ටමේ සහතික රාශියක් තිබ්බ නිසා. මාව තේරුණේ දෙවන කණ්ඩායමට. 1985 අග හරියේදී පත්වීම් දෙනවා කිව්වාට අපිට රස්සා හම්බවුනේ 1986 දී. උසස් පෙළ කරන්න මගේ බලාපොරොත්තුවක් තිබ්බේ නෑ. ඒත් පත්වීම හම්බුවෙන්න කල්යන නිසා ඔහේ ගිහින් විභාගේ ලියුවා. පාඩම් නොකර ගිහින් විභාග ලියුවාට පාස් වෙන්නේ නැනෙ (සිනාසෙයි).



කොහොමින් කොහොම හරි 1986 ජනවාරි මාසයේදී හික්කඩුවේ තිබ්බ පුහුණු කඳවුරකට සහභාගී වුණා. ඊට මාස තුනකට විතර පස්සේ මගේ පළමු පත්වීම ලැබුණා නුවරඑළිය පොරමඩුල්ල කණිෂ්ඨ විද්‍යාලයට. අවුරුදු තුනක දුෂ්කර සේවයෙන් පස්සේ මම ආවා මාගම්මන මහා විද්‍යාලයට. ඒ කාලේ ක්‍රීඩා ගුරුවරු අඩු නිසා මම මාගම්මන මහා විද්‍යාලයට අමතරව හෝමාගම මධ්‍ය මහා විද්‍යාලයේ සහ කිරිවත්තුඩුව විජයවර්ධන විද්‍යාලයේ ක්‍රීඩා ගුරුවරියක් විදියට කටයුතු කළා.
එතනින් පස්සේ මම එනවා මහරගම බුවනෙකබා විද්‍යාලයට. අවුරුදු 100ක් පරණ ඉස්කෝලේ ඉස්සෙල්ලාම සමස්ත ලංකා තරඟාවලියට දරුවෙක් සහභාගී කරවන්න මට හැකිවුණා. ''

**" ඔබ ධර්මපාලයට ආපහු එනවා 2001දී. එතැන් සිට මතකය අවදි කළොත් කෙසේද? "**

මගේ තිබ්බ ලොකුම හීනයක් වුණේ ධර්මපාලයට ඇවිල්ලා දරුවන්ට මම

දන්න දේ උගන්වන්න. 2001 මැයි මාසේ 04 වැනිදා මගේ ඒ හීනය සම්පූර්ණ වෙනවා. මට දැනුණේ මගේ ගෙදරට ආවා වගේ. ඒ දවස්වල පාසලේ දරුවන්ව ක්‍රීඩා තරඟවලට ගෙනියන්න ක්‍රීඩා ගුරුවරියක් හරියට හිටියේ නෑ. මම පාසලට එනකොට ළමයි සියලුදෙනාම මාව ඉතාමත් ආදරෙන් පිළිගත්තා. ඒගොල්ලොත් එක්ක මම දවල් රෑ බලන්නේ නැතුව වැඩ කළා. 2018 අප්‍රේල් 04 වැනිදා මම විශ්‍රාම යනකන්ම දරුවන්ව ක්‍රීඩා තරඟවලට ගෙනියලා, පාසලේ ක්‍රීඩාව ඉහළටම ගෙනියන්න හැකි උපරිමෙන්ම කටයුතු කළා. ''

**" ගුරුවරියක් විදියට ඔබතුමිය ලබපු ලොකුම ජයග්‍රහණය මොකක්ද? "**

"ළමයින්ට උගන්නලා ලබන්න පුළුවන් උපරිම සතුට සහ ලොකුම ජයග්‍රහණය ලැබුවා. සාමාන්‍ය පෙළ විභාගයේ සෞඛ්‍ය විෂයේ සමත් ප්‍රතිශතය නොකඩවා අවුරුදු 17ක් පුරාවට 95% ට වඩා වැඩි අගයක් අරන් දෙන්නට මට හැකියාව ලැබුණා. ඒක මම ලබපු ලොකුම ජයග්‍රහණයක්. මගෙන් ගුටි කාපු ළමයි අනන්තවත් ඇති. ඒත් ඒ හැම ළමයාම මට හුඟක් ආදරෙයි. මට ඒක දැනෙනවා. මොකද මම ළමයින්ට සැලකුවේ මගේම දරුවන්ට වගේ.''

**" ඔබ දැල්පන්දු ක්‍රීඩාවටත් ගොඩක් අදරෙයි නේද? "**

'' මගේ පණටත් වැඩිය ආදරෙයි. 2001 ඉඳන් ඉස්කෝලේ දැල්පන්දු දියුණු කරන්න සෑහෙන්න මහන්සි වුණා. පළාත්, සමස්ත ලංකා ජයග්‍රහණවලට අමතරව දරුවන්ව ජාත්‍යන්තර තරඟාවලි වලට සහභාගී කරවන්න හැකිවුණා. මේ සියල්ලම කළේ තනියම නෙමෙයි. ගොඩාක් පිරිසක් මට උදව් කළා. මේ වෙලාවේ ආදරෙන් මතක් කරන්න කැමතියි M.R. හේමලතා ගුරුතුමියව. ඇය ජ්‍යෙෂ්ඨ ගුරුවරියක් වශයෙන් ඉතාමත් වටිනා උපදෙස් මට ලබාදුන්නා. ඒ වගේම K.D. චන්ද්‍රා ගුරුතුමියවත් මම මතක් කරන්න කැමතියි.''

**" ඉතින් මිස්, අපේ කතාව අවසන් කරන්න කලින් මොනවහරි දෙයක් කියන්න තියෙනවාද? "**

''මගේ පාසලට කරපු සේවය මෙච්චරයි කියලා කියන්න බැහැ. ඒක මට ලස්සන සිහිවටනයක්. ලස්සන හීනයක් වගේ. ඉතින් ඒ සුන්දර සිහින එක්ක මම අද ජීවත් වෙනවා. ගුරුවරියක් විදියට මම කරපු සේවය ගැන මම 500% ක් තෘප්තිමත්. දම්පල් සෙවණේ හැදිලා වැඩිලා, ධර්මපාලයට සේවය කරන්න ලැබීම මට ලැබුණු ලොකුම භාග්‍යයක්. අදත් මම ඉස්කෝලෙට යනවා, හෙටත් මම යයි. පාසලට කරන්න පුළුවන් ඕනෑම උපකාරයක් කරන්න මම අදත් සූදානම්.''

හියල් චතුර බියගමගේ

# කැටපත් පවුර

සම්පාදනය - මේබලා නදීශානි

මිනීමරුවාගේ විලාපය..

වැසී සුදෝ සුදු හිමෙන්
සුසැහැදිලි කාල වර්ණ මග
නටයි පැන පැන උඩ
සුරතල් කුක්කා ඒ මත ඒ මේ අත

එතරම් උනන්දුවක් ...
එතරම් උද්වේගයක් ...
එතරම් උත්කර්ෂයක්...
තලයි අත්පොඩි සැම

කිසිවෙකු නොදුටු සුදු මරණ පරීක්ෂන වාර්ථාවේ
සුසැහැදිලි කාල වර්ණයෙන් ලියැවී තිබුනි
සීතල දරා ගනු නොහී
ඌ දිවියට සමුදුන් වග ....

බුද්ධික රොෂාන්
2004

සුදු අරලියා මල්
පොකුරු මැද ......
ගෙවු ඒ සුන්දර
අතීතය .......
එකට එක් වී සිප් සතර කළ
ඒ අරුම කාලය .....
මිතුදමෙහි අරුත
කියා දුන් ඒ
සොදුරු පාසල් විය ...
නැවත නැවත අපේ
දිවියට වසන්තයක්
වී පැමිණේ නම් .....
කොතරම් අගනේද ?

තිළිණි ශෂාලිකා
2004

පරතරය

ඇත
නැණ වඩා ගත්තවුන්
නැත
උන්ට කුස පිරෙන්නට යමක්

ඇත
කට වඩා ගත්තවුන්
නැත
උන්ට තඩි බඩට වඩා වෙන යමක් ....

ඇත
නැණ මෙන්ම කට වඩා ගත්තවුන්
නැත
උන්ට ජීවත් වෙන්නට අවස්ථාවක්...

අරුණි රශ්මිකා ජයසිංහ
2006

විදු මවුනි අවසරද

අරලියා සෙවණ යට
නුබෙ තුරුලෙ සැනසෙන්න
අකුරු කල කාලයට
යළි යළිත් දිව යන්න .....
සිතට නෑ සැනසිල්ල
දම්පියස දැක ගන්න
විදු මවුනි අවසරද
ආයෙමත් මට එන්න.....

උපේඛා තිශ්ශංක
2006

නගන හැම පියවරකම,
සිතන හැම සිතිවිල්ලකම,
නගන හැම හසරැල්ලකම,,
ගෙවී ගොස් තිබුණා ජීවිතයේ සාර
තිස්සාර තත්පර .....
මතක ගොන්නක් හිතෙහි දරා,
නේක දුක් කම්කටොලු කරපින්නා,
පියනැඟිය යුතුය ඉදිරි මග ඔස්සේ,
කෙසේ හෝ ජයගන්න ලද දිවියේ
අරුත..
හිමිවීම අහිමිවීම දෝතින්
දරාගෙන..
සිනහවකින් මුව සරසාගෙන

මේබලා නදීශානි
2006

පිපි කුසුමක සුවඳ වෙලා
මද පවනක සිසිල වෙලා
ළඟ රැදෙනා හුස්ම වෙලා
සදු වී ලොව එකලු කළා

සිනහව වී මුවේ රැදුණු
අරමුණ වී ළඟම රැදුණු
කවියක් වී සිතේ ගෙතුණු
ඔබමයි හිරු සදා දිලුණු

දරු පෙම හද තුළ කැටි කොට
සෙනෙහෙත් ගත ලේ කිරි කොට
පෙව් ඒ ලේ කිරි මහිමෙට
සදා ණය ගැතිය නුඹ හට

දිලිනි ලාංකිකා
2002

<u>My Scribbled Poem</u>

On my working top
Polished yet untidy
A blank sheet rustles
From the chilling wind
That comes through
My window

Yet,
I have no poem
To be penned down

Each day, every passing second
Tired yet wide awake
In the crammed 5.45 train
Hand in hand, You and I
Journeying together
To cherish their little smiles

Yet,
I would pick up
A trampled train ticket
From the moving floor beneath us
Because
I have a poem
To scribble down

But my darling
It would look meaningless
To You
Today
To many of you
It would

Yet,
When the world becomes
Much better tomorrow
You will read
My scribbled poem
With eternal love

By Hiyal Biyagamage

පෙරදින මතක ගුලි කර සිතේ....
පෙරමග සලකුණු මැකිලා
නැතේ....
පෙරලෙස පාසැල් විදු පියසේ...
හැඩවැඩ එකලු පෙරමග දිරියයි
අපගේ

කල්පිත කොදාමුල්ල
2006




2019 / 2020 වසරේ පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයීය සිසු සිසුවියන්ගේ ක්‍රීඩා කටයුතු , ක්‍රීඩා පරිපාලිනී මාලිනී යටවර ගුරුමෑණියන්ගේ අධීක්ෂණ යටතේ සිදු වූ අතර එම දක්ෂතා පහත පරිදි සාරංශ ගත කළ හැක.

## දැල් පන්දු

13 න් පහළ A සහ B කණ්ඩායම්, 15 න් පහළ කණ්ඩායම හා 19 න් පහළ කණ්ඩායම් 2019 අගෝස්තු මස පැවති ජාතික ශූරතා තරගාවලිය සඳහා සහභාගී වීම.

## චෙස් තරඟ

ඉමාෂි අභිෂේකා, නිෂිත භාෂණ, පසිඳු දූලේන් යන ශිෂ්‍ය ශිෂ්‍යාවන් ආසියානු ශූරතා චෙස් තරගාවලිය සඳහා සහභාගී වූ අතර එයින් නිෂිත භාෂණ එරින් කැන්ඩිඩේට් ගෞරව සම්මානයෙන් පිදුම් ලැබීය.

ඊට අමතරව විදුන දිල්සර සිසුවා ආසියානු චෙස් තරගාවලිය සඳහා සහභාගී විය.

## මළල ක්‍රීඩා

2019 වසරේ මළල ක්‍රීඩා අංශයෙන් ධර්මපාලීයයන් ජයග්‍රහණ විශාල සංඛ්‍යාවක් ලබා ගත් අතර ඒ අතරින් බස්නාහිර පළාත් පාසැල් මළල ක්‍රීඩා තරගාවලියේදී සෙනුරි අනුත්තරා ක්‍රීඩිකාවගේ 18 න් පහළ බාලිකා මීටර 100 කඩුලු මතින් දිවීමේ නව තරග වාර්තාව කැපී පෙනේ.

මීට අමතරව මෙම ක්‍රීඩිකාව 18න් පහළ බාලිකා මීටර 400 කඩුලු මතින් දිවීමේ තරගයෙන්ද ප්‍රථම ස්ථානයට පත් විය.

බස්නාහිර පළාත් පාසැල් මළල ක්‍රීඩා තරගාවලියේ 16 න් පහළ බාලක උස පැනීමේ අංශයේ උදිල් වින්සරින් ශිෂ්‍යයා ප්‍රථම ස්ථානයට පත් විය. මොහු එම වසරේම පැවති ජාතික කණිෂ්ට මළල ක්‍රීඩා තරගාවලියේ උස පැනීමේ තරගයෙන් ද ප්‍රථම ස්ථානයට පත් විය.

එමෙන්ම ජෝන් ටාබට් ජ්‍යෙෂ්ට පාසල් මළල ක්‍රීඩා තරගාවලියේදී සෙනුරි අනුත්තරා මීටර 100 කඩුලු මතින් දිවීම තරගයෙන් නව තරග වාර්තාවක් තබමින් ප්‍රථම ස්ථානය ද, යොහාන් ක්‍රීඩකයා මීටර 400 කඩුලු මතින් දිවීම තරගයෙන් ප්‍රථම ස්ථානය මෙන්ම උදිල් වින්සරින් උස පැනීම ඉසව්වෙන් ප්‍රථම ස්ථානය දිනා ගනිමින් දක්ෂතා දක්විය.

සමස්ථ ලංකා පාසැල් සහය දිවීමේ තරගාවලියේදී බාලක මීටර 50 X 4 තරගයෙන් ප්‍රථම ස්ථානය ලබා ගැනීමට 14 න් පහළ බාලක කණ්ඩායම සමත් විය.

සමස්ත ලංකා මළල ක්‍රීඩා තරගාවලියේදී නව තරග වාර්තාවන් බිහිකරමින් උදිල් වින්සරින් හා සෙනුරි අනුත්තරා තම ඉසව් තුලින් කැපී පෙනෙන දස්කම් දක්විය.

## ජල ක්‍රීඩා

ශ්‍රී ලංකා පාසැල් ජල ක්‍රීඩා සංගමය විසින් 2019 වසරේ සංවිධානය කළ ශ්‍රී ලංකා පාසැල් ආධුනික පිහිනුම් තරගාවලියේ බාලක කණ්ඩායම 5 වන ස්ථානය හා බාලිකා කණ්ඩායම 6 වන ස්ථානය ලබා ගන්නා ලදී.

16 න් පහළ බාලක අංශයේ පී.එච්.ඩී.එම්. ජයතිලක විසින් 50 m පසුපස නිදහස් ආර, මීටර 50 සමනල ආර, මීටර 200 කේවල ප්‍රථම ස්ථානය හිමිකර ගත් අතර ජනුනි ලතිත්මා විසින් 50m පසුපස ආර තරගයෙන් ප්‍රථම ස්ථානය ලබා ගන්නා ලදී.

## බැඩ්මින්ටන්

ශ්‍රී ලංකා පාසැල් බැඩ්මින්ටන් සංගමය විසින් 2019 වසරේ කෑගල්ල නගර සභා සංකීර්ණයේදී පැවැත්වූ තරගාවලියේදී ජයග්‍රහණ වාර්තා කිරීමට දම්පල් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ සමත් වූහ.

19 න් පහළ බාලක B කාණ්ඩයේ අනුශූරතාවය දිනාගත් කණ්ඩායම එච්.එල්.ඒ. ලකිඳු කාවින්ද (නායක), ඉසුරු ඉඳුසර (උප නායක), එම්.ආර්.එන්.එස්. විරත් මඩහපොල, ඒ. ඔෂමික සත්රුවන්, කේ.ටී. තරූෂ මධුභානු, ඩී.පී.රුක්ෂාන් චානුක, පී.පී.චමිඳු ශිහාර, ඩී.එම්.විමෙත් වින්සිලු, බී.එම්. තිදස් දම්සර, ඩී.එම්. තිසල් දිනිඳු ගෙන් සමන්විත විය.

19 න් පහළ බාලිකා බී කාණ්ඩයේ තෙවන ස්ථානය දිනාගත් කණ්ඩායම වනූයේ, එච්. දූලානි සන්දීපනී, ජේ.ඒ.සසංකා තත්සරණී දිල්හාරා, ඉමාෂා සිත්මිණි, නිපුනි අනුපමා, ඩී. අමන්දි තරුෂිකා, රකිතා සොනාලි ගෙන් සමන්විත විය කණ්ඩායම වේ.

එමෙන්ම 2019 වසරේ මහනුවර නගර සභා ක්‍රීඩා සංකීර්ණයේදී පැවැත්වූ 13 න් පහළ ද්විත්ව බැඩ්මින්ටන් ශූරතා තරගාවලියේදී අප පාසලේ බාලක බාලිකා කණ්ඩායම් විසින් ජයග්‍රහණ ලබා ගන්නා ලදී.

13 න් පහළ බාලිකා බී කාණ්ඩයේ අනුශූරතාව දිනූ කණ්ඩායම ඊ.එම්.නෙලි බිමන්සා, ඕ. චමෝදි හිරන්‍යා, තනුරි ජයෝද්‍යා, සෙනුත්මි ඉමල්යා, චේත්යා නිම්තකී, මෙතුලිමා දිල්මනි, පී. ලහන්සා, ඩබ්.පී. පෙමින්දි සහන්සා, සෙතුමි සෙහන්සා, නෙතුල්යා තෙවන්මි, ඩබ්.නෙතුෂි තර්ෂිකා, තිමන්සා ඉඳුවරී, යන දරු දූරියන්ගෙන් සමන්විත විය.

13 න් පහළ බාලක බී කාණ්ඩයේ තෙවන ස්ථානය දිනාගත් කණ්ඩායම පහත පරිදි වේ. කේ.ආර්.ඒ. මෙනුක මිනුවර (නායක), ලසත් වින්දිය (උප නායක), එස්.ඒ. චනිදු ලෂේන්, එම්. මිතුන් මිහිරංග කොස්තා, රම්ඳු රශ්මින් වල්පිට, එම්.ඒ. ලකිත් චේතිය, තිලිණ සංජය අලවත්තගේ, පී. මෙතුක සන්දිය, ඩබ්.එම්. සනුග හෙලිඳු, ඩී.භානුක ෂෙනාල්, ඩබ්.පී. සෙනුඳ නෙත්මිර.

ශ්‍රී ලංකා බැඩ්මින්ටන් ජ්‍යෙෂ්ඨ යුගල ජාතික සංචිතයට මනූත් මින්දිය පැලවත්ත ශිෂ්‍යයා 2020 අගෝස්තු මස තේරී පත් වී ඇත.

## ජිම්නාස්ටික්

අවු. 12 න් පහළ අංශයෙන් පහත ජයග්‍රහණ ලබා ගැනීමට අප පාසලේ සිසු සිසුවියන් සමත් විය. එහිදී, පිනුම් අශ්වයා ඉසව්වෙන්
බාලක අංශයෙන් මනුක තෙහාන් රාජපක්ෂ ප්‍රථම ස්ථානයද,බාලිකා අංශයෙන් විශා විර්නිගි මුණසිංහ දෙවන ස්ථානය ද ජයග්‍රහණය කළහ.

එමෙන්ම 14න් පහළ බාලක අංශයෙන් කවිනු වෙනුරක රාජපක්ෂ ආධාරක අශ්වයා ඉසව්වෙන් ප්‍රථම ස්ථානය ද, පී. තුෂාර් රෝෂන් කරුණාරත්න භූමි ව්‍යායාම අංශයෙන් තෙවන ස්ථානය ද හිමි කර ගෙන ඇත.

එමෙන්ම වයස අවුරුදු 16 න් පහළ බාලක අංශයෙන් පසන් මධුශාන් ටී. හරිස්චන්ද්‍ර විසින් ආධාරක අශ්වයා අංශයෙන් දෙවන ස්ථානය ද, භූමි ව්‍යායාම අංශයෙන් තෙවන ස්ථානයද, සමාන්තර පෝල යටතේ තෙවන ස්ථානය ද හිමි කර ගෙන ඇත. එමෙන්ම බාලිකා අංශයේ ජේ.වී. ඉසුම්යා නෙත්මිණි ශිෂ්‍යාව සමබර දණ්ඩ අංශයෙන් පළමු ස්ථානය ද, ඔලිම් නෙතාශා නිඳුවරී ශිෂ්‍යාව අසමානසම පෝල අංශයෙන් දෙවන ස්ථානය ද, පිනුම් අශ්වයා අංශයෙන් තෙවන ස්ථානය ද හිමි කරගෙන ඇත.

18 න් පහළ බාලක අංශයෙන් ඩබ්.කෞෂල්‍ය ධනෝජ් දහනායක ශිෂ්‍යයා විසින් රෝමානු වලලු ඉසව්වෙන් තෙවන ස්ථානය හිමි කරගෙන ඇත.

2019 සමස්ථ ලංකා පාසැල් ජිම්නාස්ටික් ක්‍රීඩා තරඟාවලියෙන් 14 න් පහළ බාලක අංශයෙන් කවිනු වෙනුරක රාජපක්ෂ විසින් ආධාරක අශ්වයා ඉසව්වෙන් ප්‍රථම ස්ථානය ද, සොහාන් තාරක පෙරේරා භූමි ව්‍යායාම ඉසව්වෙන් දෙවන ස්ථානය ද හිමි කර ගෙන ඇත.

16 න් පහළ බාලක බාලිකා දෙඅංශයෙන්ම ජයග්‍රහණ ලබා ගැනීමට අප පාසැල සමත් විය. බාලක අංශයෙන් පසන් ටී. මධුෂාන් ආධාරක අශ්වයා ඉසව්වෙන් ප්‍රථම ස්ථානය ද, රවිඳු සසංක රණසිංහ ආධාරක අශ්වයා හා හරස් දණ්ඩ දෙඅංශයෙන්ම දෙවන ස්ථානයද හිමි කර ගෙන ඇත. එමෙන්ම බාලිකා අංශයෙන් ජේ.වී.සිතුමියා කිත්මිණී සමබර දණ්ඩ අංශයෙන් දෙවන ස්ථානය ද, මල්මි නෙතාශා නිඳුවරී අසමසම පෝල් අංශයෙන් දෙවන ස්ථානය ද හිමි කරගෙන ඇත.

එසේම 18 න් පහළ බාලක අංශයෙන් ඩබ්.කෞෂල්‍ය ධනෝජ් ශිෂ්‍යා නිශ්චල වලලු අංශයේ තෙවන ස්ථානය ද ලබා ගන්නා ලදි.

## රග්බි

2020 SLSRV බස්නාහිර පළාත් සත් සාමාජික රග්බි තරඟාවලියෙන් 12 න් පහළ බාලක අංශයෙන් අප පාසල් කණ්ඩායම් 2 ක් මෙම තරඟාවලියට සහභාගි වූ අතර එහිදි A කණ්ඩායම ශාන්ත සෙබස්තියන් විදුහලට එරෙහිව ලකුණු 5 ට 15 ක් ලෙසද, S.D.S ජයසිංහ විදුහලට එරෙහිව ලකුණු 10 ට 15 ක් ලෙසද, ජය වාර්තා කළහ. B කණ්ඩායම කොට්ටාව ආනන්ද විද්‍යාලයට එරෙහිව ලකුණු 0 ට 15 ක් ලෙසත් , ලලිත් ඇතුලත්මුදලි විද්‍යාලයට එරෙහිව 10 ට 15 ලෙසත් ජයග්‍රහණය ලබා ගත්හ. එසේම අප විද්‍යාලයේ අවු. 10 න් පහළ කණ්ඩායම විසින් කේරි විද්‍යාලයට එරෙහිව ලකුණු 0 ට 10 ක් ලෙස ද ජයග්‍රහණය ලබා ගත්හ.

## ඉලක්කයට වෙඩි තැබීම

ජර්මනියේ මියුනිච් නුවර පැවති H&N කුසලාන අන්තර්ජාතික 10 m වායු තුවක්කු ශුරතාවලිය සඳහා 10m වායු රයිෆල් කණිෂ්ඨ බාලිකා අංශය නියෝජනය කරමින් කේ.විස්මි අමන්දා තරුපතිනි ක්‍රීඩිකාව සහභාගි වූ අතර 10m වායු පිස්තෝල කණිෂ්ඨ බාලිකා අංශය සඳහා ඩබ්.ඩබ්.එස්.එස්.සමන්මලි ක්‍රීඩිකාව සහභාගි විය.

2019 NSSF වායු තුවක්කු ශුරතාවලියේදී 10m වායු රයිෆල් කණිෂ්ඨ බාලිකා ඒකල අංශයෙන් තෙවන ස්ථානයද, කණිෂ්ඨ මිශ්‍ර අංශයෙන් දෙවන ස්ථානය ද හිමි කර ගැනීමට කේ.විස්මි අමන්දා ක්‍රීඩිකාව සමත් විය. එමෙන්ම 10m වායු පිස්තෝල කණිෂ්ඨ බාලිකා අංශයෙන් ප්‍රථම ස්ථානය හිමි කර ගැනීමට ඩබ්.ඩබ්.එස්.එස්.සමන්මලි ක්‍රීඩිකාව සමත් විය. එම ඉසව්වේ ජ්‍යෙෂ්ඨ බාලිකා අංශයේ තෙවන ස්ථානය හිමි කර ගැනීමට බී.ඒ.ටී.එස්. නවෝද්‍යා ක්‍රීඩිකාව සමත් විය.

NSSF ජාතික ශූරතා තරඟාවලියේදී 10m වායු රයිෆල් බාලිකා (විවෘත) අංශයෙන් 4 ස්ථානයද, කණිෂ්ඨ මිශ්‍ර අංශයෙන් (New NCR) ප්‍රථම ස්ථානය ද හිමි කර ගැනීමට කේ.විස්මි අමන්දා ශිෂ්‍යාව සමත් විය.

එමෙන්ම 10m වායු පිස්තෝල කණිෂ්ඨ බාලිකා අංශයෙන් ප්‍රථම ස්ථානය ද මිශ්‍ර අංශයෙන් ප්‍රථම ස්ථානය ද හිමි කර ගැනීමට ඩබ්.ඩබ්.එස්.එස්.සමන්මලී ක්‍රීඩිකාව සමත් විය.

10m වායු පිස්තෝල බාලිකා ජ්‍යෙෂ්ඨ අංශයෙන් තෙවන ස්ථානය හිමිකර ගැනීමට බී.ඒ.ටී.එස්.නවෝද්‍යා ක්‍රීඩිකාව සමත් විය.

හර්ෂ රණසිංහ

# 13 වන පෙරමග සය සාමාජික ක්‍රිකට් තරඟාවලිය

13 වන වරටත් සංවිධානය කරනු ලැබූ පෙරමග සය සාමාජික සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලිය මෙවරත් අති සාර්ථකව නිමාවට පත් විය. එදින ප්‍රධාන ආරාධිතයන් වශයෙන් අප පාසලේ ආදි ශිෂ්‍යාවක් වන වර්තමාන ශ්‍රී ලංකා කාන්තා ක්‍රීකට් කණ්ඩායමේ දක්ෂ තුන් ඉරියව් ක්‍රිකට් ක්‍රිඩිකාවක වන ඔෂධි රණසිංහ , වර්තමාන ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයෙකු වන කුසල් ජනිත් පෙරේරා සහ අප විදුහලේ විදුහල්පති තුමන් වන කේ.ජී. විමලසේන ගුරු පියාණන් ඇතුලු සම්භාවනීය අමුත්තන් රැසක් සහභාගි විය.

මෙවර තරඟාවලිය සඳහා කණ්ඩායම් 25 කට අධික ප්‍රමාණයක් ඉදිරිපත් විය.




මෙම තරඟාවලියේ විශේෂත්වයක් වනුයේ මෙතෙක් කල් අපරාජිත කණ්ඩායමක්ව සිටි අරංගල නව රැල්ල කණ්ඩායමට මෙවර ශූරතාවය අහිමි වීමයි. මෙවර ශූරතාවය හිමි කරගත්තේ සංජීව කාරියවසම් මහතාගේ අනුග්‍රහය යටතේ ක්‍රීඩා කළ නිම්තරු කන්ස්ට්‍රක්ෂන් කණ්ඩායමයි.

මෙවර විචිත්‍රවත් ඉසව්වක් ලෙස කාන්තා ක්‍රිකට් කණ්ඩායම් දෙකක් තරඟ වැදුනි. ඒ අනුව පෙරමග කාන්තා ක්‍රිකට් කණ්ඩායම හා සියසර කාන්තා ක්‍රිකට් කණ්ඩායම සහභාගී වූ තරඟයෙන් පෙරමග කාන්තා ක්‍රිකට් කණ්ඩායම ජයග්‍රහණය කිරීමට සමත් විය. සෑම වසරක් පාසා මෙම තරඟාවලිය පැවැත්වීමට මූලික අරමුණ වන්නේ ආදි සිසු සිසුවියන්ගේ සුහදත්වය වර්ධනය කර ගැනීමයි.



නිශාදි රුක්ෂාණි

# STOP COVID -19

## COVID 19

වලින් ආරක්ෂා වීම සඳහා

# නිෂ්පාදිත මුඛ ආවරණ

පාසලෙන් ඔබට මිලදී ගත හැක

| Size | Price |
|---|---|
| S | Rs.70/- |
| M | Rs.80/- |
| L | Rs.80/- |



**2 LAYER MASK**

100% ක්ම කාබනික පරීක්ෂාවට
ලක් වූ අමුද්‍රව්‍ය භාවිතා කර ඇත.

CONTROLUNION | GLOBAL ORGANIC TEXTILE STANDARD · GOTS ·

**ලබා ගත හැකි ස්ථාන**

ආදි ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන කාර්යාලය

ආපන ශාලා කාර්යාල ලිපිද්‍රව්‍ය අලෙවි සැල

වැඩි විස්තර ආදි ශිෂ්‍ය කාර්යාලයෙන්
ලබා ගත හැක.

විමසීම්: 0718 984 600


**PAST PUPILS ASSOCIATION**

DHARMAPALA VIDYALAYA
PANNIPITIYA